

වාර්ෂික වාර්තාව 2022



නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

පටුන

- සභාපතිතුමාගේ සමාලෝචනය..... 4
- අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය සහ සංයුතිය..... 6
- උපදේශක කමිටු සමාලෝචනය සහ සංයුතිය 7
- විගණන හා කළමනාකරණ කමිටුවේ සමාලෝචනය..... 8
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය..... 9
- භෞතික සංවර්ධන වැඩසටහන..... 10
- නිම කරන ලද නිවාස ව්‍යාපෘති වල නිවාස හිමිකම් හා ඔප්පු ලබාදීම්..... 15
- මානව සංවර්ධන වැඩසටහන..... 16
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය අභ්‍යන්තර ඉපයීම් 25
  (අයකිරීම්) ප්‍රගතිය - 2022
- මානව සම්පත් සංවර්ධන සහ ආයතන කළමනාකරණය..... 26
- අවසන් ගිණුම් වාර්තා 29
- විගණකාධිපතිවරයාගේ වාර්තාව 39

දැක්ම

"සාඩම්බර ජීවිතයක් උදෙසා තිරසාර නාගරික ජනාවාස ගොඩනැගීම"

මෙහෙවර

"සුසැදි, සංයුක්ත හා සුරැකි බව රැඳුනු නාගරික ජනාවාස ගොඩනැගීම සහ භෞතික, සාමාජීය සහ ආර්ථික වශයෙන් ප්‍රජාවන් සවිබල ගැන්වීම"

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අභිමතාර්ථ

- සෑම නාගරික ප්‍රදේශයක් සඳහාම සැලසුම් සහගත සංයුක්ත නාගරික ජනාවාස ඇති කිරීම.
- නාගරික ප්‍රජාවන්ගේ ආර්ථික හා සාමාජීය සංවර්ධනය වැඩිදියුණු කිරීම.
- නාගරික ප්‍රජාවන් තුළ දේපල හිමිකාරිත්වය පිළිබඳව හැඟීමක් ඇති කිරීම.
- අධිකාරියෙහි කාර්ය සාධනය විශිෂ්ටත්වයට පත් කිරීම.
- ස්වයං අරමුදල් සහිත ආයතනයක් බවට පත්වීම.

සභාපතිතුමාගේ සමාලෝචනය



නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් නාගරික ප්‍රදේශයන්හි ජීවත්වන අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන තත්ත්වය සමාජ, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් බල ගැන්වීම සඳහා භෞතික සංවර්ධන හා මානව සංවර්ධන ලෙස දෙවැදෑරුම් ප්‍රවේශයක් ඔස්සේ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි.

ඒ අනුව, 2022 වර්ෂය තුළදී නාගරික අඩු හා මැදි ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් භෞතික සංවර්ධන ව්‍යාපෘති හා මානව සංවර්ධන වැඩසටහන සැලසුම් කරන ලදි. එහිදී, ලුනාව "සී වීව් රෙසිඩන්සිස්" ව්‍යාපෘතියෙහි නිවාස විකුණුම් පදනම මත මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව වෙත බැහැර කිරීමේ ක්‍රියාවලිය සාර්ථක ලෙස සිදුකිරීමට හැකිවීම අධිකාරියෙහි සුවිශේෂී අවස්ථාවක් වේ.

නාගරික අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් සැලසුම් කරන ලද භෞතික සංවර්ධන ව්‍යාපෘතීන් වන තුඩුවේගොඩ සහ නාවලපිටිය අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතීන්හි මූලික අනුමැතීන් ලබාගැනීම සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) යාන්ත්‍රණය යටතේ රජයට වැය බරක් නොවී මෙම ව්‍යාපෘති 02 ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම 2022 වර්ෂය තුළදී සිදුකරන ලදි.

එමෙන්ම, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් වත්තල, "වැලිසර හයිට්ස්" මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය, නිට්ටඹුව ඕවඩවත්ත නිවාස ව්‍යාපෘතිය සහ කඩුවෙල මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන්හි ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකිරීම සහ ආයෝජකයකු තෝරාගැනීම සඳහා ව්‍යාපෘති අභිලාෂයන් (EOI) කැඳවීමට අදාළ මූලික කටයුතු සිදුකිරීමට 2022 වර්ෂය තුළදී හැකි විය

භෞතික සංවර්ධන ව්‍යාපෘති ඉහත පරිදි ක්‍රියාත්මක කරන ලද අතර, නාගරික අඩු හා මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් මානව සංවර්ධන ව්‍යාපෘති රැසක් දීප ව්‍යාප්තව සිදුකරන ලදි. එහිදී , රු.මිලි. 10ක ප්‍රතිපාදන උපයෝජනය කරමින් "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන යටතේ, දිස්ත්‍රික්ක 11ක් ආවරණය වන පරිදි නාගරික ජනාවාසයන්හි ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන් උසස් කරලීම සඳහා "සෞභාග්‍යා ප්‍රජා ශක්ති", "සෞභාග්‍යා සවිබල", "සෞභාග්‍යා නැණබල", "සෞභාග්‍යා දිවිවරුණ" සහ 2022 ලෝක ජනාවාස දින වැඩසටහන හා සමගාමී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි ණය අයකිරීම් අංශය මගින්, අධිකාරිය විසින් නිම කරන ලද නිවාස ව්‍යාපෘති 10 ක නිවාස ප්‍රතිලාභීන්ගෙන් ණය වාරික අයකිරීම් කටයුතු විධිමත් ලෙස මේ වන විට සිදුකරමින් පවති. ඒ අනුව, එහි ප්‍රගතිය 2021 වසරට සාපේක්ෂව 38%ක වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි.

එමෙන්ම, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි සමස්ථ කාර්යමණ්ඩලයෙහි කාර්ය සාධනය ඉහල නැංවීම සඳහා පුහුණු වැඩසටහන් සඳහා යොමු කරන ලද අතර, සේවක ධනාත්මක චින්තනය හා රසාස්වාදය වැඩිදියුණු කරනු වස් සම්පත් දායකයින් හරහා කාර්ය මණ්ඩලය වෙත වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. සේවක මානසික තත්ත්වය සමබරව පවත්වාගෙන සැහැල්ලුවෙන් රාජකාරි කිරීමට හැකි පරිසරයක්

ගොඩනගනු වස් මාසික ධර්ම දේශනා වැඩසටහන් පැවැත්වීම යනාදිය සිදුකරමින්, අධිකාරියෙහි සේවක කාර්යක්ෂමතාවය, ඵලදායීත්වය හා සේවක තෘප්තිමත් භාවය ඇති කිරීමට හැකි සෑම අවස්ථාවකදීම පියවර ගන්නා ලදි

රට තුළ වර්තමානය වන විට උද්ගත වී ඇති තත්ත්වය මැනවින් තේරුම්ගෙන, ආයතනයක් වශයෙන් සමස්ත කාර්ය මණ්ඩලය සමග එක්ව, එම තත්ත්වයන්ට නොබියව මුහුණ දෙමින්, අවම පිරිවැයක් යටතේ අඛණ්ඩව නාගරික අඩු ආදායම්ලාභී සහ මැදි ආදායම්ලාභී ප්‍රජාවගේ භෞතික හා මානව සංවර්ධනය වෙනුවෙන් දීප ව්‍යාප්තව ව්‍යාපෘති හා වැඩසටහන් ඉදිරියටත් ක්‍රියාත්මක කරමින්, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි ඒකායන අරමුණ සාක්ෂාත් කරගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි.

ප්‍රියන්ත කේ. රත්නායක
සභාපති
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය සහ සංයුතිය

නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන ප්‍රජාවගේ නිවාස ගැටළු සඳහා විසඳුම් ලබා දීම හා ඔවුන්ව සාමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් බලගැන්වීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය අරමුණ වේ. ඒ සඳහා භෞතික හා මානව සංවර්ධනය යන දෙවැදෑරුම් ප්‍රවේශයන් යටතේ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

1971 අංක 38 දරණ මුදල් පනතේ 12 වැනි සහ 13.6 වැනි වගන්තිය ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබන සියලුම ගණුදෙනු නිසි පරිදි ගිණුම්ගත කර, ගිණුම් පොත් පවත්වාගෙන යාම, සහතික කිරීමේ වගකීම සහ අධිකාරියේ ගිණුම් කටයුතුවල සහ අදාළ වර්ෂය සඳහා අතිරික්තයේ/ ඌණතාවයේ සත්‍ය සහ සාධාරණ මතයක් සපයාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධිකාරිය වෙත පැවරී ඇත. ඒ අනුව, නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යන ලෙසටත්, නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වල දී සහ විගණන කම්ටුව හරහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලෙසටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය වෙත නියෝග කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සෑම අවස්ථාවකටම අදාළ වන පරිදි නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගත කර ගැනීමටත්, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු මගින් තහවුරු කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සළකා බලා ඇත. අධිකාරිය සතු වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා සොයා ගැනීමට සහ ඒවා වළක්වා ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට ප්‍රායෝගිකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ වත්කම් ආරක්ෂා කර ගැනීමට සහ එහි වාර්තාවන් හි නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය ප්‍රායෝගිකව හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනීමට හැකි වන පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් ක්‍රමානුකූල ආකාරයට ඉටු කිරීමට අවශ්‍ය කරන අභ්‍යන්තර පරීක්ෂා කිරීම, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලනවලින් සමන්විත ඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සභාපතීත්වය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සභාපති ප්‍රියන්ත කේ. රත්නායක මහතා විසින් දරණු ලබයි. 2022-12-31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

ප්‍රියන්ත කේ. රත්නායක මහතා : සභාපති; නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
නිමේෂ් හේරත් මහතා : සභාපති; නාගරික සංවර්ධන අධිකාරිය
රජීව් සුරියාරච්චි මහතා : සභාපති; ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
බී.ඒ.ආර්.සී. පියරත්න මහතා : නි. අධ්‍යක්ෂ; ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ඊ.එම්.එන්. එදිරිසිංහ මහත්මිය : ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්; පළාත් පාලන හා පළාත් සභා රාජ්‍ය අමාත්‍යාංශය
නලීන් සමරකෝන් මහතා
කේ.ටී.කේ. ප්‍රසන්න අරම්පත් මහතා
ජී.සී.ඒ.යූ. ප්‍රනාන්දු මහතා
ඩී.එස්.ජේ. හේවාවිතාරණ මහතා

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් : අධ්‍යක්ෂ ජනරාල්
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

උපදේශක කමිටු සමාලෝචනය සහ සංයුතිය

2008 අංක 36 දරන නා.ජ.සං. අධිකාරී පනතින් 10 වන වගන්තිය ප්‍රකාරව උපදේශක කමිටුව පිහිටුවනු ලැබීය.

ප්‍රමාණවත් ස්ත්‍රී පුරුෂ නියෝජනයක් ඇති බවට සහතික වෙමින් උපදේශක කමිටුව සභාපතිවරයෙකුගෙන් සහ සාමාජිකයින් 14 දෙනෙකුට වැඩි නොවන පිරිසකගෙන් උපදේශක මණ්ඩලය සමන්විත විය යුතු බව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ සඳහන් වී ඇත. ඒ අනුව 2022-12-31 දිනට අධිකාරියේ උපදේශක කමිටු සංයුතිය පහත පරිදි වේ.

මහාචාර්ය රංගික හල්වතුර මහතා : සභාපති
එච්.බී.වි.ධමෙන්ද්‍ර මහතා
කාලිංග තිලකරත්න මහතා
එන්.ඩි.රුවන් කුමාර මහතා
ජයන්ත කුමාර අතපත්තු මහතා
ජේ.බී.ඇල්ලේපොල මහතා
ආර්.ඒ.එස්.කේ.කුලරත්න මහතා
ආර්.ජී.සි.පි.රණතුංග මහතා
ආර්.ජී.ජී.දිනේෂ් මහතා
ආර්.පි.සිල්වා මහත්මිය
බී.ජී.ජයතිලක මහතා
ප්‍රියන්ත රත්නායක මහතා
කේ.අනිල් වික්‍රමසිංහ මහතා
කේ.එම්.ඩි.කේ.කරුණාදාස මහතා
ජී.ඒ. එල්. එන්. අබේවික්‍රම මහතා

විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය

මනා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයක් පවතින බව සහතික කිරීම සඳහා සහ කළමනාකරණයට සහ අදාළ බලධාරීන්ට නිවැරදි, යෝග්‍ය සහ කාලීන වූ තොරතුරු සපයා දීමට හැකිවන පරිදි එය හොඳින් කළමනාකරණය කෙරෙන බව සහතික කිරීම සඳහාත්, නීති සහ අධිකාරියේ ප්‍රතිපත්තිවලට සහ ව්‍යවස්ථාපිත සහ සංස්ථාපිත පාලනයන්ට අනුකූල වන පරිදි ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන කළමනාකරණය කිරීම සඳහාත්, සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල විගණන කමිටුවට පැවරී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් (02) විගණන කමිටුව සමන්විත විය. 01/2022 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, සමන් ජයසිංහ මහතා කමිටු සභාපති ලෙස කටයුතු කළ අතර ඊ.එම්.එන්. එදිරිසිංහ මහත්මිය සහ නීතිඥ එෆ්.එන්.සමානා සනූස් මහත්මිය කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

2022-08-18 දින පැවති 07/2022 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, අධ්‍යක්ෂ මණ්ඩල සටහන් අංක 07/2022/N-07 අනුව විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන් ලෙස රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, නියෝජ්‍ය අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ, බී.ඒ.ආර්.සී. පියරත්න මහතා කමිටු සභාපති ලෙසත්, අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වන නීතිඥ නලින් සමරකෝන් මහතා සහ ජී.සී.ඒ.යූ. ප්‍රනාන්දු මහතා කමිටු සාමාජිකයින් ලෙසත් පත්කරන ලදි. ඒ අනුව 2022-09-02 දින පැවති 02/2022 2022-09-23 දින පැවති 03/2022 සහ 2022-12-13 දින පැවති 04/2022 කමිටු රැස්වීම්වල ඉහත මහත්ම මහත්මීන් කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

රජයේ විගණන අධිකාරී සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වූ අතර අවශ්‍ය පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අංශ ප්‍රධානීන් හා අවශ්‍ය අවස්ථාවන්හිදී අනෙකුත් නිලධාරීන් රැස්වීම්වලට සහභාගි විය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය. අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද 2022 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම කමිටුව විසින් සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැති සඳහා නිර්දේශ කරන ලදි.


විගණන වාර්තා, විගණන විමසුම්වලට අදාළ ගැටළු සහ පිළිතුරු, අභ්‍යන්තර හා බාහිර විගණනයන්හි නිරීක්ෂණ, අභ්‍යන්තර පාලන පද්ධතීන් මෙන්ම වාර්ෂික වාර්තාව නිසිකලට සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමද ඇතුළත්ව වැඩි දියුණු කිරීම් අවශ්‍ය අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව කමිටුව සාකච්ඡා කරන ලදි. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ගනු ලැබූ තීරණවලට අදාළ පසුවිපරම් ක්‍රියාමාර්ගද සාකච්ඡා කරන ලදි. සාකච්ඡා කරන ලද ප්‍රමුඛ කරුණු ඇතුළත් රැස්වීම් සාකච්ඡා සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදි. සාමාජිකයින්, නිරීක්ෂකයින් සහ නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය මෙන්ම විශේෂයෙන්ම විගණන ක්‍රියාවලියේදී විගණකාධිපති විසින් ලබාදුන් ඉතා වටිනා නිරීක්ෂණයන්ද ඉතා අගය කොට සළකමි.

විගණන හා කළමනාකරණ කමිටුවේ අණ පරිදි

අධ්‍යක්ෂ ජනරාල්,


විගණන හා කළමනාකරණ කමිටු ලේකම්, නා.ජ.ස.අ.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය



භෞතික සංවර්ධන වැඩසටහන





නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2022 වසරෙහි ක්‍රියාත්මක කරීම සඳහා අඩු අදායම්ලාභී නාගරික ප්‍රජාව වෙනුවෙන් අඩු අදායම් නිවාස ව්‍යාපෘති දෙකක් හා මධ්‍ය අදායම් නාගරික ප්‍රජාව වෙනුවෙන් නිවාස ව්‍යාපෘති 4ක් සැලසුම් කර තිබුණි.

එමෙන්ම 2021 වර්ෂයෙහි ජනතා අයිතියට පත්කරන ලද ලුනාව "සී වීව්" නිවාස ව්‍යාපෘතියෙහි නිවාස ඒකක මාධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව වෙත අලෙවිකිරීමේ කටයුතුද සිදුවිය

මම ව්‍යාපෘතිවල අත්කරගත් භෞතික මෙන්ම මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත පරිදි සටහන් කල හැකිය.

ලුනාව "සී වීව් රෙසිඩන්සිස්" නිවාස ව්‍යාපෘතිය

කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව නාගරික බල ප්‍රදේශය තුල පවතින තානායම්වත්ත නැමති ඉඩමෙහි, නිවාස ඒකක 356 කින් සමන්විත "ලුනාව නාගරික නිවාස ව්‍යාපෘතිය" 2012 වර්ෂයේදී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලදි. මෙම නිවාස ව්‍යාපෘතිය 2021 වර්ෂයේ අප්‍රේල් මස 09 වන දින ජනතා අයිතියට පත් කරන ලදි. වර්ග අඩි 410කින් සමන්විත නිවාස ඒකකයක් නිදන කාමර 02ක්, විසිත්ත කාමරයක්, කුඩා ප්‍රමාණයේ ප්‍රැන්ටියක් සමඟ එළිමහන් සඳළුතලයකින් සමන්විත වන අතර, විදුලි සෝපාන, ප්‍රජා ශාලා, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසල්, අභ්‍යන්තර මාර්ග සහිත රථ ගාල් වැනි අත්‍යාවශ්‍ය අංගෝපාංගයන්ගෙන් යුක්තව නිවාස සංකීර්ණය ඉදිකරන ලදී.

විකුණුම් පදනම මත බැහැර කරන ලද මෙම ව්‍යාපෘතියෙහි මූල්‍ය වශයෙන් අත්කරගන්නලද ප්‍රගතිය 2021 වර්ෂයට හා 2022 වර්ෂයට අදාලව සංසන්දනාත්මකව පහත දැක්වේ.

ගෙවීම් ක්‍රමවේදය	විකුණුම් වටිනාකම				මුදල් ලැබීම	
	2021 වර්ෂය		2022 වර්ෂය		2021 වර්ෂය	2022 වර්ෂය
	නිවාස ඒකක ගණන	විකුණුම් වටිනාකම (රු.මිලි.)	නිවාස ඒකක ගණන	විකුණුම් වටිනාකම (රු.මිලි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
100%	78	396.36	140	704.46	369.36	664.80
50%	98	499.26	178	912.91	257.59	460.38
25%	110	552.84	13	66.36	141.05	18.74
කාර්යය මණ්ඩල	11	46.30	22	94.80	1.40	2.50
එකතුව	297	1,467.76	353	1,778.53	769.39	1146.32

2022 වර්ෂයේදී අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලද අඩු ආදායම් නිවාස ව්‍යාපෘති

තුඩුවේගොඩ නාගරික අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

තුඩුවේගොඩ නාගරික අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 59(A) හික්කඩුව නාගරිකය යන ග්‍රාම නිලධාරී වසමේ කුඩාගොඩවවෙලදෙනිය යන ඉඩමේ ඉදිකිරීමට නියමිතව තිබුණි. මෙහි සුනාමියෙන් අවතැන් වූ පවුල් 32ක් සඳහා නිවාස එකක 32කින් යුක්ත අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සැලසුම් සකස් කර තිබුණි. එහි ව්‍යාපෘති පිරිවැය වන රු. මිලි. 158ක මුදල 2022 අයවැය ප්‍රතිපාදන මගින් වෙන්කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කළ ප්‍රතිපාදන නොලැබීමත් හා 2022.04.26 දිනැතිව අංක BD/CBP/01/01/04-2022 දරන ලද රාජ්‍ය වියදම් පාලනය යන මැයෙන් නිකුත්කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අනුව මෙම ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා 2022.12.31 වන දිනට ව්‍යාපෘතියට අදාල මුලික කටයුතු සිදුකිරීම හා මුලික අනුමතින් ලබාගැනීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි අභ්‍යන්තර ප්‍රතිපාදන වලින් රු. මිලි. 0.94ක් වියදම් කර තිබුණි.

කෙසේ නමුත් මෙම ව්‍යාපෘතිය අඩු අදායම් හා මාධ්‍ය අදායම් දෙකම සහිත නිවාස ව්‍යාපෘතියක් ලෙස රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) යාන්ත්‍රණය යටතේ රජයට වැය බරක් නොවී ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමුකර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි.

නාවලපිටිය නාගරික අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

නාවලපිටිය බටහිර ග්‍රාම නිලධාරී වසමට අයත් සොයිසාකැලේ කම්කරු නිවාස සංකීර්ණයට අයත් ඉඩමෙහි නිවාස සඳහා වූ ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිව අවිධිමත් නිවාස වල වසර 50ක පමණ කාලයක සිට ජීවත්වන නගරය තුළ අවිධිමත් රැකියාවල නියුතු කම්කරු පවුල් 83ක් වෙනුවෙන් අඩු අදායම් නිවාස ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණි.

නමුත්, මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කළ ප්‍රතිපාදන නොලැබීමත් හා 2022.04.26 දිනැතිව අංක BD/CBP/01/01/04-2022 දරන ලද රාජ්‍ය වියදම් පාලනය යන මැයෙන් නිකුත්කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අනුව මෙම ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා 2022.12.31 වන දිනට ව්‍යාපෘතියට අදාල මුලික කටයුතු සිදුකිරීම හා මුලික අනුමතින් ලබාගැනීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි අභ්‍යන්තර ප්‍රතිපාදන වලින් රු. මිලි. 1.73ක් වියදම් කර තිබුණි.

2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලද මධ්‍ය ආදායම් නිවාස ව්‍යාපෘති

නිවාස ව්‍යාපෘතිය	ව්‍යාපෘතිය පිලිබඳ විස්තරය		නිවාස ඒකක ගණන	ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලි.)	2022-12-31 වන දිනට මුල්‍ය ප්‍රගතිය (රු.මිලි.)	ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත වර්ෂය
	භූමිය	2022-12-31 වන දිනට තත්ත්වය				
වත්තල, "වැලිසර හයිට්ස්" මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය	වත්තල, මිල්ලගහවත්ත ඉඩම (හෙක්ටයාර 2.4532)	ඉඩමෙහි අයිතිය නා.ජ.සං.අ. වෙත ලැබී ඇත. ආයෝජකයකු තෝරාගැනීම සඳහා ව්‍යාපෘති අභිලාෂයන් (EOI) කැඳවීමට කටයුතු කරමින් පවතී.	408	8,873.53	2.06	2025
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය	ශ්‍රී ජයවර්ධනපුර නැපැල් කාර්යාලය පිහිටි ඉඩම (හෙක්ටයාර් 0.2963)	මූලික නිශ්කාෂණ අනුමැතීන් ලබාගෙන ඇත. ඉඩම සම්බන්ධයෙන් 'O' රේඛා චිත්‍රය ඇඳීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	160	8,909.62	1.06	2025
නිට්ටඹුව ඕවඩ්වත්ත නිවාස ව්‍යාපෘතිය	නිට්ටඹුව "ඔර්චර්ඩ් වත්ත" (හෙක්ටයාර 3.6932)	ඉඩම LRC වෙතින් මිලදී ගෙන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය නමින් ගැසට් කර ඇත. ව්‍යාපෘති යෝජනා කැඳවීම (RFP) හා ව්‍යාපෘති අභිලාෂයන් (EOI) කැඳවීම සිදුකරමින් පවතී.	130	4447.11	61.97	2024
කඩුවෙල මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය	කඩුවෙල නැපැල් කාර්යාලය පිහිටි ඉඩම (හෙක්ටයාර 0.2757)	සැලසුම් නිරාකරණ හා මූලික නිශ්කාෂණ අනුමැතීන් ලබාගෙන ඇත. තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉඩමේ තක්සේරුව ලබාදෙන මෙන් ඉල්ලීමක් යොමුකර ඇත. ඉඩම අධිකාරිය වෙත පවරා දීම සඳහා නව සංශෝධිත පිඹුරක් සකස් කිරීමට, ප්‍රාදේශිය ලේකම් විසින් ඉල්ලීමක්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.	112	3800.00	1.14	2025

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2022 වසරෙහි කියාත්මක කරීම සඳහා මධ්‍ය අදායම් නාගරික ප්‍රජාව වෙනුවෙන් නිවාස ව්‍යාපෘති 4ක් සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘති 4 රාජය පෞද්ගලික සහභාගිත්ව ක්‍රමවේදය යටතේ සිදුකිරීම සඳහා සැලසුම් කර තිනුණි. ඒවානම් වත්තල, ශ්‍රී ජයවර්ධනපුර, නිට්ටඹුව සහ කඩුවෙල යන නිවාස ව්‍යාපෘතීන් වේ.

මෙහිදී 2022 වසර තුල මෙම ව්‍යාපෘතිවල මූලික අනුමතින් ලබාගැනීමට අදාල කටයුතු, ඉඩම් පවරාගැනීමේ කටයුතු සහ ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අදාල මූලික කටයුතු සිදුකරන ලදී. මෙම වසර තුල පවති ආර්ථික අර්බුධය හමුවේ රට තුල සියලුම ඉදිකිරීම් කටයුතු අඩපන වූ අතර අප ව්‍යාපෘති සඳහාද ව්‍යාපෘති සංවර්ධකයකු හෝ ආයෝජකයෙකු සොයාගැනීම අසීරු විය. 2022-12-31 දිනට මෙම ව්‍යාපෘති 4 සඳහා අත්කරගත් ප්‍රගතිය පිලිබඳ තොරතුරු ඉහත වගුවෙහි දැක්වේ.

2022 වර්ෂයේදී ක්‍රියාත්මක කල වෙනත් භෞතික සංවර්ධන ව්‍යාපෘති

ප්‍රජා ව්‍යාපෘති : සිරි විමලසිරි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීම

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සමාජ සජීවීකරණ අංශයේ නිපුන සවිය වැඩසටහනට අදාළව මූල්‍ය ප්‍රතිපාදන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩයාල ග්‍රාමසේවා වසමේ ප්‍රජාවගේ ඉල්ලීම මත කසාගල ශ්‍රී විමලසිරි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමට යෝජනා විය. රු. මිලියන 4.5 ක් පිරිවැයක් දර සිදුකරන ලද මෙම ව්‍යාපෘතිය 2022.01.07 දින ජනතා අයිතියට පත් කරන ලදී.



අවිච්ඡේද ව්‍යාපෘති : අඟුලාන නිවාස ව්‍යාපෘතිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අඩු අදායම් නිවාස ව්‍යාපෘතියක් වන අඟුලාන නිවාස ව්‍යාපෘතියෙහි මහල් 04ක කවුළු සඳහා දැල් ගැසීම හා තාප්පය වටා කොන්ක්‍රීට් බැම්මක් ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී. ඒ සඳහා රු. මිලියන 4.3ක් වැයකෙරිණි.

නිම කරන ලද නිවාස ව්‍යාපෘති වල ප්‍රතිලාභීන්ට නිවාස හිමිකම් හා ඔප්පු


බොරැල්ල "සහස්පුර" මහල් නිවාස ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් වෙත ඔප්පු ලබාදීම

බොරැල්ල "සහස්පුර" නිවාස ව්‍යාපෘතිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ පූර්වගාමී ආයතනය වන රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් "තිරසර පුරවර" වැඩසටහන යටතේ කොළඹ මහ නගර සභා කලාපය තුළ අඩු පහසුකම් මධ්‍යයේ ජීවත් වූ පවුල් ඉලක්ක කරගනිමින් ඉදිකරනු ලැබූ මහල් නිවාස යෝජනා ක්‍රමයකි. මෙහි නිවාස ඒකක 329 ක් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යටතේ පවතී. එම නිවාස ඒකක අතුරින් ගෙවීම් අවසන් කර ඇති ප්‍රතිලාභීන් 23 දෙනෙකු වෙත ඔප්පු ලබාදීම 2022 වසර තුල සිදුකරනු ලැබිය.

අඟුලාන "සයුරුපුර" මහල් නිවාස ව්‍යාපෘතියේ නිදහස් දීමනා මත බැහැර කළ නිවාසයන් සඳහා ගිවිසුම්ගත වීම

01/2021 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව නිදහස් දීමනා ලෙස ලබාදුන් මොරටුව අඟුලාන "සයුරුපුර" නිවාස සංකීර්ණයේ ප්‍රතිලාභීන් 15 දෙනෙකු විසින් නිවස සඳහා වන රු. 1,500,000/- ක මුදල ගෙවීමට එකඟව 2022 වර්ෂය තුළ ගිවිසුම් අත්සන් කරන ලදී. ගෙවීම් අවසන් කලපසු එම ප්‍රතිලාභීන් වෙත ඉදිරියේදී නිවාස ඔප්පු ලබාදීමට නියමිතය.

මානව සංවර්ධන වැඩසටහන







"ස්වශක්ති" – මානව සංවර්ධන වැඩසටහන 2022

2022 වර්ෂය තුලදී ද මානව සංවර්ධන වැඩසටහන අඩු ආදායම්ලාභී නාගරික ප්‍රජාව ක්‍රියාකාරී ලෙස මැදිහත් කර ගනිමින් හා ඔවුන්ව ඒ සඳහා දිරිමත් කරමින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර, මෙහිදී එක් එක් වැඩසටහන උප වැඩසටහන් කිහිපයක් ඇතුළත්ව එහි ප්‍රධාන වැඩසටහනේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාවට නංවන ලදී. මෙම කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන සහ සිවිල් සමාජ හවුල්කාරී වූ අතර, ඔවුන්ට බෙහෙවින් ස්තුති වන්ත විය යුතුය.

Covid 19 වෛරසය පැතිරීමේ වර්ධනය වැඩිවීම සහ වර්තමානයේ පවතින ආර්ථික අභියෝග හමුවේ නාගරික ජනාවාසයන්හි ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මහත් වෙහෙසක් දරණු ලැබීය. දීප ව්‍යාප්තව දිස්ත්‍රික්ක11 ක නාගරික ජනාවාස 23ක නිවාස ඒකක 5,706 ක ජීවත් වන කුටුම්භ 7,619 ක සමාජ- ආර්ථික තත්ත්වය නඟා සිටුවීම 2022 වර්ෂය තුළ "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන යටතේ සිදු කරන ලදී.

<u>ඉලක්ක - 1</u>

සෞභාග්‍යා ප්‍රජා ශක්ති – සමාජීය වශයෙන් ප්‍රජාව බල ගැන්වීම

සෞභාග්‍යා ප්‍රජා ශක්ති වැඩසටහන යටතේ අඩු ආදායම් ලාභීන් අතර, ප්‍රජා මුල සංවිධාන ඇති කර සංස්කෘතිමය විවිධත්වය තේරුම් ගනිමින් ප්‍රජාව තනි තනිව හා සාමූහික ලෙස සාමාජීය වශයෙන් බල ගැන්වීම සිදු කරයි.

සාර්ථකත්වයට නිදසුන් 1:

ගාල්ල බෝගහවත්ත ජනාවාසයේ කුඩා කණ්ඩායම් ඉතුරුම් වැඩසටහන ඉතා සාර්ථක වැඩසටහනක් විය. මෙහි කණ්ඩායම් 02 ක් පවතින අතර, එම කණ්ඩායම් දෙකෙහිම ඉතුරුම් ලෙස රු. 111,825.00 ක් ලෙස වර්ධනය වී ඇත. මිණිමුතු කණ්ඩායම රු. 20,000.00 සහ රු.10,000.00 ලෙස සාමාජිකයින් දෙදෙනෙකුට 2% ක පොළියට ණය ලබා දී ඇති අතර, පුද්ගල ඉතුරුම් රු. 5,000.00 සිට රු. 9,000.00 දක්වා ප්‍රමාණයක්ගෙන් ඇත. එකමුතු කණ්ඩායම රු. 10,000.00 බැගින් 3 කුට, රු. 5,000.00 බැගින් 2 කුට සහ රු. 2,500.00 බැගින් එක් අයෙකුට 4% පොළියට ණය ලබා දී ඇත. මෙහි පුද්ගල ඉතුරුම් රු. 4,000.00 ක මට්ටමක පවතී. එක් කණ්ඩායමක් සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විතය.

ප්‍රජා ශක්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් ලබාගත් ප්‍රතිපල

- තෝරාගත් ජනාවාස 23 ක සමාජ-ආර්ථික තත්ත්වය පිළිබඳ සමීක්ෂණ 23ක් සිදු කර තොරතුරු රැස් කර කරන ලදී.
- ජනාවාස 23ක ස්ථාපිත කරන ලද ප්‍රජා මුල සංවිධාන වල ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දෙන ලදී.
- මත්ද්‍රව්‍ය, මධ්‍යසාර සහ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව දැනුවත් කිරීම සහ වැළැක්වීම පිළිබඳව පුද්ගලයින් 824 දෙනෙකු සඳහා වැඩසටහන් 12ක් පවත්වන ලදී.
- කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන් තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සම්බන්ධකර ගනිමින් ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් 06 ක් පැවැත්වූ අතර, ඒ සඳහා ප්‍රජාව 506 ක් සම්බන්ධ විය.
- කොළඹ, ගම්පහ සහ මාතලේ යන දිස්ත්‍රික්කයන්හි ජනාවාසයන් තුළ ළමුන්, යෞවනයන් හා වැඩිහිටි ප්‍රජාව 264 දෙනෙකු සඳහා දන්ත සායන 04 ක් පැවැත්වීය.
- ගම්පහ සහ පොලොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි ලේ දංදීමේ වැඩසටහන් 02 ක් පවත්වන ලදි.
- ප්‍රජා සහභාගීත්වයෙන් ජනාවාසයන් තුළ ශ්‍රමදාන 12 ක් පවත්වන ලදි.
- ගම්පහ දිස්ත්‍රික්කයේ ජනාවාසයන්හි පවුල් 301 ක් සඳහා ගෙවතුවගා වැඩසටහන යටතේ එළවළු හා බීජ ලබාදීම.
- ගම්පහ, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, කොළඹ, මාතර, කුරුණෑගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක සඳහා පවුල් 1301 කට පොල් පැල 2715 ක් ලබා දෙන ලදි.



SP 1.1: ජනාවාස 23 හි අවශ්‍යතා හඳුනා ගැනීම



SP 1.2: ප්‍රජා මුල සංවිධානයන්හි තිරසාර ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රජා පාදක සංවිධානය ශක්තිමත් කිරීම



SP 1.3: මත්ද්‍රව්‍ය හා මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ පුනරුත්ථාපනය කිරීම



SP 1.4: ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන



SP 1.5: තිරසාර පාරිසරික ප්‍රවර්ධන වැඩසටහන

ඉලක්ක - 2

සෞභාග්‍යා සවිබල – ප්‍රජාව ආර්ථික වශයෙන් බල ගැන්වීමේ වැඩසටහන

අඩු පහසුකම් ජනාවාසවල පවත්නා කුඩා ව්‍යාපාර වැඩිදියුණු කර ගැනීමට සහ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහාය ඇතිව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් පුහුණු වැඩසටහන් හරහා අවශ්‍ය මහ පෙන්වීම ලබාදෙන ලදි.

සාර්ථකත්වයට නිදසුන් : 2

ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන තුළ ගෘහස්ථ මට්ටමින් සබන් නිෂ්පාදනය කිරීම හඳුන්වා දී ඇත. එහිදී ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ, කොරස ජනාවාසයේ ගීතා දමයන්ති මහත්මිය සබන් නිෂ්පාදනය කැට 08 කින් ආරම්භ කර ඇති අතර, සතියකට සබන් කැට 50 ක් නිෂ්පාදනය කරනු ලබයි. එක් කැටයක බර 100g කි. එය රු. 90.00 ක මුදලකට අලෙවි කරන අතර, රු. 4,500.00 ක ආදායමක් ලබයි. සතියක ශුද්ධ ලාභය රු. 1,750.00 කි.

සෞභාග්‍යා සවිබල වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් ලබාගත් ප්‍රතිඵල

- 2022 වර්ෂය තුළ ජනාවාසයන්ගෙන් ව්‍යවසායකයින් 447 ක් හඳුනා ගෙන ඇත.
- ව්‍යවසායකත්වය හරහා නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන ප්‍රජාව තුළ ක්ෂුද්‍ර/කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු 38 ක් පැවැත්වීය.
- ක්ෂුද්‍ර/කුඩා පරිමාණ ව්‍යවසායකයින් 26 දෙනෙකු සඳහා වෙළඳපල අවස්ථා නිර්මාණය කර දී ඇත.
- ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වඩා හොඳ වෙළඳපල නිරාවරණයක් සඳහා තම නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට ආහාර සහ වෙළඳ ප්‍රදර්ශන 03ක් පැවැත්වූ අතර, ව්‍යවසායකයින් 113 ක් ඊට සම්බන්ධ විය.





SS 2.1: කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම





SS 2.3: කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා වෙළඳපොල අවස්ථා හඳුන්වා දීම

SS 2.2: කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍යාධාර සහ උපකරණ ලබාදීම

ඉලක්ක - 3

සෞභාග්‍යා නැණබල – අධ්‍යාපනික අධ්‍යාපනික වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන

නාගරික ජනාවාසවල ජීවත්වන ප්‍රජාවගේ සංවර්ධන ක්‍රියාවලියට සහභාගී වීමට අවශ්‍ය මඟපෙන්වීම හා දිරිගැන්වීම් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දීම මඟින් 2022 වර්ෂයේදී තෝරාගත් ප්‍රදේශවල යෞවන සමාජ සහ ළමා සමාජ පිහිටුවීමට අප අධිකාරිය සහාය ලබා දී ඇත. තවද ජාතික ළමා රක්ෂක අධිකාරිය හා එක්ව ජනාවාස 30 ක ළමුන් හා දෙමාපියන් 1496 දෙනෙකු සඳහා ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂාව, ළමා අපයෝජනය, අපයෝජනය වැලැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. නව යොවුන් වියේ පසුවන යෞවනියන් සඳහා ඔසප් චක්‍රය සහ ගැබ් ගැනීම් පිළිබඳ සෞඛ්‍ය වැඩසටහන් ශ්‍රී ලංකාවේ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ සහයෝගය ඇතිව ළමුන් 14 දෙනෙකු වෙනුවෙන් පවත්වන ලදි.

නාගරික ජනාවාසයන්හි පාසැල් හැරගිය සහ පාසැල් අධ්‍යාපනය නිම කර ඇති අවු. 16 ට වැඩි තරුණ තරුණියන්ගේ ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ මෘදු කුසලතා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඉංග්‍රීසි පාඨමාලාවක් ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදි. නිපුණතා සංවර්ධනය කිරීමෙන් ඔවුන්ගේ අනාගතය සැලසුම් කිරීමට සහ සංවර්ධන ක්‍රියාවලියට උපකාරී වනු ඇත. ඔවුන්ගේ සන්නිවේදනය, පුද්ගල සංවර්ධනය සහ රැකියා අවස්ථාවන්හි නිසි පිළිගැනීමක් ඇතිවීම මෙහිදී ලැබෙන ප්‍රතිලාභ ලෙස දැක්විය හැකිය.

සෞභාග්‍යා නැණබල වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් ලබාගත් ප්‍රතිඵල

- ත්‍රෛයි මාසික ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව නිම කළ තරුණ තරුණියන් 50 දෙනෙකු සඳහා සහතික පත්‍ර පිරිනැමීම.
- ළමා රක්ෂක අධිකාරිය හා එක්ව ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂාව, ළමා අපයෝජනය, අපයෝජනය වැලැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 30 ක් තුළ ළමුන් හා දෙමාපියන් 1496 දෙනෙකු දැනුවත් කිරීම.
- ළමුන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් කොළොන්නාව - වඩුගොඩවත්ත ජනාවාසයේ පුස්කාලයක් ආරම්භ කිරීමට පොත් ලබාදීම.
- මූලික අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම දිරිමත් කිරීම සඳහා ළමුන් 100 දෙනෙකුට අත්‍යාවශ්‍ය පාසල් ද්‍රව්‍ය / ලිපි ද්‍රව්‍ය ලබා දී ඇත.
- Covid 19 වසංගත කාලය තුළ එදිනෙදා පාසල් විෂයයට උපකාර කිරීම සඳහා මාර්ගගත (virtual) වැඩමුළු 10 ක් පැවැත්විය.
- 5 වසර ශිෂ්‍යත්වයට මුහුණු දුන් දුවාදරුවන් 101 දෙනෙකු සඳහා පාසැල් උපකරණ කට්ටල ලබාදීම.
- ගම්පහ දිස්ත්‍රික්කයේ ජනාවාස 02 ක ළමා ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ළමුන් 71 දෙනෙකු සඳහා ගිණුම් ආරම්භ කිරීම.
- ළමා සමිති 22 ක් ආරම්භ කිරීම.



SN 3.1: තරුණ හා ළමා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම



SN 3.2: නිපුණතා සංවර්ධනය සහ වෘත්තීය පුහුණුව පිළිබඳ වැඩමුළු පැවැත්වීම

ඉලක්ක - 4

සෞභාග්‍යා දිවිවරුණ – ආගමික හා සංස්කෘතික සවිබල ගැන්වීමේ වැඩසටහන

2022 වර්ෂයේ දී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් විවිධ ප්‍රජාවන් අතර සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා බහු සංස්කෘතික සහ බහු ආගමික ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට පහසුකම් සලසමින් නාගරික අඩු පහසුකම් සහිත ප්‍රජාවන් අතර බහු-ආගමික සහ බහු සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක සෞඛ්‍ය සංවිධාන (WHO) ආයතනයේ සහයෝගයෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 40 දෙනෙකු සඳහා දින 02ක පුහුණුවක් පවත්වන ලදී.

සෞභාග්‍යා දිවිවරුණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් ලබාගත් ප්‍රතිඵල

- ප්‍රජාවන් අතර ජනවාර්ගික සාමුහිකත්වය පෝෂණය කිරීම සඳහා පවුල් 1941 ක් සහභාගී කර ගෙන බහු ආගමික වැඩසටහන් 08 පවත්වන ලදී.
- නිර්මාණශීලිත්වය සහ සෞන්දර්යාත්මක කුසලතා ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සඳහා පුද්ගලයන් 615 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලද බහු සංස්කෘතික වැඩසටහන් 13 ක් පැවැත්වීය.
- නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන අඩු ආදායම්ලාභීන් 450 දෙනෙකුට ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) ශ්‍රී ලංකාවේ පිහිටි ආයතනය හා සහයෝගය ඇතිව මනෝ-සමාජ සෞඛ්‍ය ආරක්ෂණ දැනුම සමඟ මානසික සෞඛ්‍ය සහාය වැඩසටහන් 10 ක් පවත්වන ලදි.



SD 4.1: බහු ආගමික හා සංස්කෘතික ක්‍රියාකාරකම් ඇතුළත් වැඩසටහන





SD 4.2: සංස්කෘතික, සාහිත්‍ය සහ කලා ප්‍රවර්ධන වැඩසටහන් (සාහිත්‍ය, නාට්‍ය, සංගීතය,

ඉලක්ක - 5

2022 ලෝක ජනාවාස දින වැඩසටහන

ලෝක ජනාවාස දිනය වාර්ෂිකව ඔක්තෝබර් පළමු සඳුදා සමරනු ලැබේ. මෙම අවස්ථාව මානව ජනාවාසවල තත්ත්වයන් සහ එහි ජීවත්වන ප්‍රජාවට ප්‍රමාණවත් නවාතැන් පහසුකම් සඳහා සියලු දෙනාට ඇති අයිතිය පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි. මෙම වසරේ ලෝක ජනාවාස දිනය 2022 ඔක්තෝබර් 3වන සඳුදා සමරනු ලැබීය. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් දිවයින පුරා දිස්ත්‍රික්ක 25 තුළ නාගරික, අඩු පහසුකම් සහිත ප්‍රජාවන් කේන්ද්‍ර කර ගනිමින් **“වෙනසක් නොකරමු. කිසිවෙකු හෝ කිසිතැනක්. අත්නොහැර රැක ගනිමු.”** යන මෙවර ලෝක ජනාවාස වාර්ෂික තේමාව යටතේ ක්‍රියාකාරකම්වල නිරත විය.

2022 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් අංග හතරක් සංවිධානය කර තිබුණි.

1. ළමා චිත්‍ර තරඟය (වයස 6-9, වයස 10-14 සහ වයස 15-18 යන කාණ්ඩ 3)
2. ක්ෂුද්‍ර/කුඩා/මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වෙළඳ ප්‍රදර්ශනය
3. කෙටි චිත්‍රපට තරඟය
4. නාගරික ගෙවතු වගා තරඟය

සාර්ථකත්වයට නිදසුන් : 3



ගම්පහ දිස්ත්‍රික්කයේ මහර - ගල්වත්ත ජනාවාසයේ ළමුන්ගේ සැඟවුණු නර්තන කුසලතාවයන් එළිදැක්වීම සඳහා 2022 වසරේ ලෝක ජනාවාස දින සැමරුම් උත්සව වේදිකාවේදී අවස්ථාවක් ලබාදෙන ලදි.

2022 ලෝක ජනාවාස දින වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් ලබාගත් ප්‍රතිඵල

- 2022 වසරේ ළමා සිතුවම් තරගය සඳහා නිර්මාණ 1,200 ක් ලැබුණි.
- කලාත්මක කුසලතා තවදුරටත් දිරිමත් කිරීම සඳහා එක් එක් කාණ්ඩයෙන් ජයග්‍රාහකයින් 9 දෙනෙකු සහ විශේෂ කුසලතා 21 දෙනෙකු තෝරා ගනු ගනු ලැබීය.
- ආහාර හා වෙළඳ ප්‍රදර්ශනය සඳහා ක්ෂුද්‍ර/කුඩා පරිමාණ ව්‍යවසායකයින් 52 දෙනෙකු සහභාගී විය.
- ආහාර සහ වෙළඳ කාණ්ඩවල ක්ෂුද්‍ර/කුඩා/මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් 6 දෙනෙකු ජයග්‍රාහකයින් ලෙස තෝරාගෙන මුදල් ත්‍යාග පිරිනමන ලදී.
- කෙටි චිත්‍රපටයේ ජයග්‍රාහකයින් 03 කු සඳහා ත්‍යාග පිරිනමන ලදි.
- ගෙවතුවගා තරගයේ ජයග්‍රාහකයින් 03 දෙනෙකු සඳහා ත්‍යාග පිරිනමන ලදි.








නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය අභ්‍යන්තර ඉපයීම් (අයකිරීම්) ප්‍රගතිය - 2022

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ යටතේ පවතින නිම කරන ලද නිවාස ව්‍යාපෘති 10ක නිවාස හිමි ප්‍රතිලාභීන්ගෙන් නිවාස හිමිකම් ලබාදීමේදී හිඟ ණය මුදල් හා නිවාස ණය වැඩසටහන් යටතේ ණය ලබාගත් ප්‍රතිලාභීන්ගෙන් එම ණය වාරික වශයෙන් අයකිරීම් අප අධිකාරියෙහි අයකිරීම් අංශය මගින් සිදු කරනු ලබයි. මෙහිදී නිවාස හිමිකරුවන් පුනස්ථාපන, පුනස්ථාපන නොවන, විකුණුම්, හා කුලී වශයෙන් නිවාස ලබාගෙන ඇත. 2022 වර්ෂය සඳහා මෙම අයකිරීම් පිලිබඳ ප්‍රගතිය 2021 වසරට සාපේක්ෂව පහත ප්‍රස්තාරයෙන් නිරූපනය වේ.



ඉහත ප්‍රස්තරයට අනුව 2022 වර්ෂයෙහි අධිකාරියේ අයකිරීම් අදායම රු. මිලියන 14.2 ඉක්මවන අතර එය පෙර වසරට සාපේෂව 38%ක වැඩිවීමකි.


මානව සම්පත් සංවර්ධන සහ ආයතන කළමනාකරණ කටයුතු

2022 වර්ෂය තුල ආයතනයහි සේවක කාර්ය සාධනය ඉහල නැංවීම සඳහා ක්‍රියාත්මක කල පුහුණු වැඩසටහන්

සේවක කාර්යක්ෂමතාව සහ ඵලදායිත්ව නන්වලනු පිණිස පුහුණු වැඩසටහන් රාශියක් සිදුකරන ලදී. ඒවායෙහි විස්තර පහත වගුවෙහි දැක්වේ.

අ/අ	පුහුණු වැඩසටහන	පුහුණුව ලබාදුන් ආයතනය	පිරිවැය
1	"UDA" Building Regulation	නාගරික සංවර්ධන අධිකාරිය	**55,000.00**
2	රජයේ වාහන සම්බන්ධ පුහුණු වැඩසටහන	ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය	**15,000.00**
3	Positive Thinking පුහුණු වැඩසටහන	සම්පත් දායකයෙකු මගින්	**57,673.00**
4	"CIDA" Formula Method for Adjustment to Contract Price due to Flection in Price"	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	**16,000.00**
5	නිවාඩුභාර නිලධාරියාගේ කාර්යභාරය	ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය	**10,000.00**
6	හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණ	ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය	**10,000.00**
7	ලිපිගොනුකරණය	ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය	**135,000.00**
8	Bid Evaluation & Reporting	නිපුණතා සංවර්ධන අරමුදල	**81,000.00**
9	භාණ්ඩ සමීක්ෂණය	ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය	**70000.00**
10	One day Seminar on Legal Aspects on Construction Contracts Management and Administration	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	**20,000.00**
11	Online Seminar on Essentials for Effective Contract Administration, Performance Management and Supervision Infrastructure Projects	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	**7,000.00**
මුළු පිරිවැය			**476,673.00**

ආයතනයෙහි සියලුම සේවකයන්ගේ මානසික සෞඛ්‍ය නංවාලනු පිණිස ධනාත්මක චින්තනය හා රසාස්වාදය පිලිබඳ වැඩසටහනක් සම්පත් දායකයකු මාර්ගයෙන් පවත්වන ලදී. තවද, පොහොය දිනයන් නිමිති කරගනිමින් මාසිකව දර්ම දේශනා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.











2022 වර්ෂය සඳහා පුහුණු අවස්ථා ලබාදීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017 ප්‍රකාරව සමස්ථ කාර්ය මණ්ඩලයෙන් 10% ක ප්‍රමාණයක් සඳහා පුහුණු අවස්ථා ලබාදිය හැක. ඒ අනුව, එක් පුහුණුලාභියෙකු සඳහා උපරිම මාස 06 ක සීමාවකට යටත්ව දෛනිකව රු. 500.00 දීමනාවක් ලබාදෙමින් 2022 වර්ෂය සඳහා පුහුණුලාභීන් 28 දෙනෙකුට පුහුණු අවස්ථා ලබාදී ඇත. ඒ සඳහා අධිකාරිය විසින් දරන ලද මුදල රු. 991,000/= කි.

2022 වසර තුල අධිකාරිය විසින් උසස් අධ්‍යාපන සිසුන් වෙත ලබාදුන් පුහුණු අවස්ථා පිලිබඳ විස්තර පහත පරිදි දැක්විය හැකිය.

අ/අ	පුහුණුව සඳහා යොමු කල ආයතනය	යොමු කල පුහුණු සිසුන් ගණන	2022 වර්ෂය සඳහා ගෙවීම් කර ඇති පුහුණු දීමනාව (රු)
01	ජාතික සමාජ සංවර්ධන ආයතනය	04	991,000.00
02	කැලණිය විශ්වවිද්‍යාලය - බාහිර උපාධි අපේක්ෂිකා	01	
03	කොලොන්නාව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය	17	
04	මොරටුව විශ්වවිද්‍යාලය - අභ්‍යන්තර උපාධි අපේක්ෂක	05	
05	තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථානය	01	

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ **2022.12.31** දිනට කාර්ය මණ්ඩලය

#	වැටුප් කාණ්ඩය	අනුමත ප්‍රමාණය		දැනට සිටින ප්‍රමාණය		පුරප්පාඩු	අතිරික්ත
		ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	කොන්ත්‍රාත්		
01	HM2-1	01	-	01	-	-	-
02	HM1-1	04	-	03	-	01	-
03	MM1-1	12	-	10	-	02	-
04	JM1-1	03	-	02	-	01	-
05	MA5-1	14	-	14	-	-	-
06	MA3	31	-	20	-	11	-
07	MA2-1	15	-	12	-	03	-
08	MA1-1	49	-	46	-	03	-
09	PL3	10	-	09	-	01	-
10	PL1	14	-	09	-	05	-
11	කොන්ත්‍රාත්	-	-	-	-	-	01
	එකතුව	**153**	**0**	**126**	**0**	**27**	**01**
යෝජිත මධ්‍යම අදායම් නිවාස ව්‍යාපෘතිය සඳහා							
12	කොන්ත්‍රාත්	-	13	-	03	10	-
	එකතුව	**-**	**13**	**-**	**03**	**10**	**-**
	මුළු එකතුව	**153**	**13**	**126**	**03**	**37**	**01**

- මුළු ස්ථිර සේවක සංඛ්‍යාව = 126 (සභාපතිතුමා නොමැතිව)

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

2022.12.31 දිනට

මූල්‍ය තත්ව ප්‍රකාශනය

අයිතම	**2022**	**2021**
වත්කම්		
ජංගම වත්කම්		
මුදල් හා බැංකු ශේෂය	60,162,796.92	56,179,922.48
මුදල් අත්තිකාරම්	8,872.00	322,086.32
උත්සව අත්තිකාරම්	31,250.00	33,750.00
සේවක නිවාස ණය	303,056.72	1,935,848.55
ඉන්ධන තැන්පතු	354,980.00	354,980.00
සේවක ආපදා ණය	14,955,577.74	8,740,266.99
සුභසාධන ණය	10,000.00	10,000.00
අධ්‍යාපන ණය	89,766.61	125,383.77
ලැබිය යුතු සේවා ගාස්තු - නාගරික සංවර්ධන අධිකාරිය	207,331,767.00	207,331,767.00
ලැබිය යුතු ණය - විසිරි නිවාස	-	6,047,908.85
ලැබිය යුතු ණය හා වෙනත්	740,056,093.78	442,935,419.05
ඉදිකිරීම් අත්තිකාරම්	1,323,113.95	1,323,113.95
ජංගම වෙළඳ කුටි තොගය	41,000.00	41,000.00
සම්පත් මධ්‍යස්ථාන තොග	687,105.50	687,105.50
නිවාස තොග	14,294,796.53	75,161,159.52
සහස්පුර වාණිජ ඒකක	44,777,000.00	44,777,000.00
ලුනාව නිවාස ඒකක තොගය	54,251,358.81	651,016,306.14
ලුනාව නිවාස ව්‍යපෘති තොගය	94,611,202.05	94,611,202.05
ආයෝජන	1,162,751,854.45	916,500,000.00
මුළු ජංගම වත්කම්	**2,396,041,592.06**	**2,508,134,220.17**

ජංගම නොවන වත්කම්		
ණය තොගය	581,584,752.51	429,042,347.01
කෙරීගෙන යන වැඩ	14,754,152.70	13,221,994.16
දේපළ, පිරියත හා උපකරණ	460,361,304.19	51,107,430.91
අස්පෘශ්‍ය වත්කම්		
ගිණුම්කරණ පැකේජය	500,000.00	500,000.00
මුළු ජංගම නොවන වත්කම්	**1,057,200,209.40**	**493,871,772.08**
මුළු වත්කම්	**3,453,241,801.46**	**3,002,005,992.25**
<u>වගකීම් හා ස්කන්ධය</u>		
<u>ජංගම වගකීම්</u>		
උපචිත වියදම්	72,461,817.89	112,830,040.86
කළමනාකරණ සංස්ථා අරමුදල	39,197,354.45	26,381,854.45
රඳවා ගැනීම් - ඉදිකිරීම් ව්‍යාපෘති	154,124.54	305,822.60
තුරුඉතුරුගම ණය - ඉදිරියට ලද වාරික මුදල්	7,500.00	-
තලවකැලේ ණය - ඉදිරියට ලද වාරික මුදල්	-	15,000.00
හලාවත - ඉදිරියට ලද වාරික මුදල්	-	86,346.28
හම්බන්තොට සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන	-	4,514,970.13
ලුනාව මූලික ගෙවීම් අයකිරීම්	17,458,000.00	140,605,000.00
හලාවත මූලික ගෙවීම්	1,950.00	-
ටෙන්ඩර් තැන්පතු මුදල්	10,000.00	10,000.00
විලම්භිත ආදායම් (ලුනාව)	-	751,106,192.09
භාණ්ඩාගාර ණය	-	125,016,000.00
අනුරාධපුර ඔප්පු ගාස්තු	50,275.00	-
පරිත්‍යාග - මානව සංවර්ධන වැඩසටහන	4,825.00	-
මුළු ජංගම වගකීම්	**129,345,846.88**	**1,160,871,226.41**
ජංගම නොවන වගකීම්		

පාරිතෝෂික වෙන් කිරීම	28,186,117.50	25,147,323.00
ආපදා ණය වෙන් කිරීම	15,000,000.00	15,000,000.00
මුළු ජංගම නොවන වගකීම්	**43,186,117.50**	**40,147,323.00**
මුළු වගකීම්	**172,531,964.38**	**1,201,018,549.41**
	-	-
ශුද්ධ වත්කම්	**3,280,709,837.08**	**1,800,987,442.84**
	-	-
ස්කන්ධය හා සංචිත	-	-
භාණ්ඩාගාර ප්‍රදාන	1,987,156,586.43	716,109,824.18
ස්ථාවර වත්කම් සඳහා වූ භාණ්ඩාගාර ප්‍රදාන	8,604,229.82	5,745,875.31
	-	
ඒකාබද්ධ අරමුදල		6,641,977.00
රාජ්‍ය ප්‍රදාන	470,898,036.77	108,034,839.91
ආදායම් සංචිත	36,625,000.00	36,625,000.00
ප්‍රත්‍යාගනණ සංචිත	38,515,350.07	39,259,145.55
භාණ්ඩාගාර ප්‍රදාන-මානව සංවර්ධන වැඩසටහන	3,672,705.86	6,285,000.00
	2,545,471,908.95	**918,701,661.95**
	-	-
ශේෂ ආදායම (වියදම) ඉ/ගෙ	97,666,409.77	97,666,409.77
පෙර වර්ෂය සඳහා ආදායම් (වියදම්) අතිරික්තය	272,849,771.84	784,619,371.12
		-
කාල පරිච්ඡේදය සඳහා ආදායම් (වියදම්) අතිරික්තය	364,721,746.52	
	735,237,928.13	**882,285,780.89**
	-	-
මුළු ස්කන්ධය	**3,280,709,837.08**	**1,800,987,442.84**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්ය සාධන වාර්ථාව

අයිතම	**2022**	**2021**
ආදායම්	-	-
භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්ථන	155,000,000.00	155,000,000.00
භාණ්ඩාගාර ප්‍රදාන - මානව සංවර්ධන වැඩසටහන	-	26,980,000.00
විලම්භීත ආදායම්-ස්ථාවර වත්කම්	11,391,602.17	3,233,180.83
පොලී ආදායම්	161,823,661.56	22,129,237.42
වෙනත් ආදායම්	12,986,065.96	4,963,703.95
නිවාස ව්‍යාපෘතින්ගෙන් ලද ලාභය	232,269,606.31	766,350,947.45
වත්කම් අපහරණයෙන් ලද ලාභය	-	15,369,916.70
භාණ්ඩාගාර ප්‍රදාන - හොරණ නිවාස ව්‍යාපෘතිය	-	8,804,705.87
මුළු ආදායම	**573,470,936.00**	**1,002,831,692.22**
	-	-
පරිපාලන වියදම්	-	-
පුද්ගල වේතන	**118,945,680.27**	**100,482,235.61**
විගණන හා කළමනාකරණ කමිටු දීමනා	225,000.00	-
අයවැය අනුමත අතිරේක දීමනා	7,664,059.13	-
ජීවන වියදම් දීමනා	11,862,827.07	-
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	1,262,000.00	970,000.00
සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය	9,244,333.60	9,275,940.89
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වය	2,311,083.36	2,191,864.60
නිවාඩු දින දීමනා	1,600,700.00	-
වෙනත් දීමනා	230,000.00	1,793,050.00
අතිකාල වියදම්	4,469,889.26	4,867,094.11
වැටුප්	65,165,746.73	73,917,036.51
සේවක දීමනා -අධ්‍යක්ෂ මණ්ඩල	62,000.00	-
සේවක වන්දි ගෙවීම්	572,840.00	-
පාරිතෝෂික ගෙවීම්	4,401,239.50	4,512,017.50
සේවක දිරි දීමනා	4,740,000.00	1,755,000.00
දුරකථන දීමනා-නිළධාරී	693,459.67	-
දුරකථන දීමනා-සේවක	675,000.00	-
පුහුණු දීමනා	848,000.00	-
ප්‍රවාහන දීමනා	757,500.00	-
නිළඇඳුම් දීමනා	195,000.00	64,500.00
වාහන දීමනා	600,000.00	-
සුභසාධන වියදම්	1,365,001.95	1,135,732.00
	-	-

<u>ගමන් වියදම්</u>	**1,949,976.62**	**426,040.57**
දේශීය-සංයුක්ත දීමනා-නිළධාරීන් සඳහා	215,000.00	-
දේශීය-සංයුක්ත දීමනා-සේවක	604,400.00	-
ගමන් වියදම් - දේශීය	1,130,576.62	426,040.57
<u>සැපයීම්</u>	**16,656,620.44**	**10,615,268.23**
ඉන්ධන	7,442,656.17	4,046,941.99
පුවත්පත් වියදම්	-	26,630.00
අනෙකුත් වියදම්(සැපයුම)	876,901.80	1,236,965.55
මුද්දර	569,018.00	169,302.50
ලිපිපිදුව්‍ය	7,768,044.47	5,135,428.19
<u>ගිවිසුම් ගත සේවා</u>	**38,670,983.37**	**41,979,091.24**
නවාතැන් පහසුකම් වියදම්	22,250.00	54,200.00
ප්‍රචාරණ/ ප්‍රදරශන වියදම්	608,902.00	856,102.50
විගණන ගාස්තු	-	1,000,000.00
බැංකු ගාස්තු	5,410.00	2,166.00
බැංකු ගාස්තු (IPG)	48,480.70	-
උත්සව වියදම්	871,018.00	562,424.75
පිරිසිදු කිරීමේ වියදම්	993,841.30	957,744.00
මෙහෙයුම් කල්බදු වාරික ගෙවීම (වාහන)	3,667,300.78	10,253,645.00
නීති වියදම්	592,135.00	323,872.67
කාරයාල කුළිය	25,412,887.50	21,501,385.20
අනෙකුත් වියදම් (සේවා)	124,915.00	530,894.74
මුද්‍රණ වියදම්	824,341.00	2,500,735.00
ණය අයකිරීම් අංශයේ වියදම්	285,509.01	87,524.39
ආරක්ෂක වියදම්	180,000.00	30,500.00
පරිපාලන වියදම් (ව්‍යාපෘති)	7,995.69	4,483.70
සජීවීකරණ/වෙනත් අංශ වියදම්	284,585.00	-
දුරකථන වියදම්	1,187,279.50	1,300,489.49
පුහුණු කිරීමේ වියදම්	556,653.00	830,740.00
ප්‍රවාහන වියදම්	2,997,479.89	1,182,183.80
<u>නඩත්තු වියදම්</u>	**6,443,832.32**	**8,614,314.85**
ගිණුමකරන මෘදුකාංග පද්ධතිය අලුත්වැඩියාව	72,000.00	-
පරිගණක නඩත්තු	223,075.62	326,300.00
කාරයාල උපකරණ නඩත්තු	1,020,402.60	1,356,566.68
වාහන නඩත්තු	3,926,657.97	3,519,907.48
ගොඩනැගිලි	383,869.26	2,824,239.08
වාහන රක්ෂණය	817,826.87	587,301.61

<u>වෙනත් පුනරාවර්ථන වියදම්/වෙන් කිරීම්</u>	**17,286,721.76**	**24,614,031.50**
අබලි ද්‍රව්‍ය අපහරණය	18,049.75	-
ක්ෂය -ලී බඩු හා සවිකිරීම්	805,086.20	635,817.13
ක්ෂය -පරිසණක	6,705,075.26	6,105,780.18
ක්ෂය - රියදුරු විවේකාගාරය	142,560.00	35,640.00
ක්ෂය - කාර්යාල උපකරණ	1,580,457.99	1,639,642.03
ක්ෂය - ගබඩා ගොඩනැගිලි	275,400.00	20,560.68
ක්ෂය - වාහන	6,779,452.05	5,565,550.68
ක්ෂය - අනුරාධපුර ගොඩනැගිලි	980,640.51	245,160.13
ආපදා ණය අරමුදල	-	9,305,245.35
අඩමාණ ණය වෙන් කිරීම-විසිරි නිවාස	-	1,060,635.32
<u>සංවර්ධන වියදම්</u>	**8,795,374.70**	**31,481,339.10**
අඟුලාන නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම්	448,076.72	524,880.00
අනුරාධපුර නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම්	116,294.00	-
බඹරකැලේ නිවාස ව්‍යාපෘති -ප්‍රාථමික වියදම්	15,108.24	-
හලාවත නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම්	659,899.53	-
හොරණ නිවාස ව්‍යාපෘතියේ වියදම්	-	8,559,544.41
ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන	6,646,548.17	22,047,013.63
ලුනාව නිවාස ව්‍යාපෘතිය විවෘත කිරීමේ වියදම්	-	0.01
ලුනාව නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම්	73,713.00	-
ශ්‍රී වික්‍රමපුර ව්‍යාපෘතියේ වියදම්	830,935.04	253,785.66
තලවකැලේ නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම්	4,800.00	96,115.39
මුළු වියදම්	**208,749,189.48**	**218,212,321.10**
	-	-
කාල පරිච්ඡේදය සඳහා වූ අතිරික්තය/(ඌනතාවය)	**364,721,746.52**	**784,619,371.12**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2022	**2021**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
<u>ලැබීම්</u>		
භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්ථන)	155,000,000.00	155,000,000.00
අනෙකුත් ආදායම්	7,533,991.07	1,343,180.54
ඉතුරුම් තැන්පතු පොළී ආදායම්	480,479.85	146,864.27
මුදල් අත්තිකාරම්	2,020,756.00	-
ඔප්පු ගාස්තු	539,945.00	186,190.00
පරිත්‍යාග	4,825.00	-
නිවාස ව්‍යාපෘති විකුණුම් ආදායම	289,227,250.00	792,720,000.00
	454,807,246.92	949,396,234.81
<u>වියදම්</u>		
මුදල් අත්තිකාරම්	8,909,064.02	353,701.35
වැටුප් හා අනෙකුත් දීමනා	104,515,038.02	90,351,833.81
අතිකාල හා ගමන් වියදම්	2,500,662.41	4,643,233.08
සේවා හා සැපයුම්	13,827,030.21	11,451,983.57
ගිවිසුම්ගත සේවා	46,681,663.27	30,268,563.32
නඩත්තු වියදම්	6,641,029.33	7,351,643.14
මානව සංවර්ධන වැඩසටහන	7,693,251.81	22,213,263.00
අනෙකුත් ආදායම් නැවත ගෙවීම්	466,678.50	-
උත්සව අත්තිකාරම්	703,750.00	65,166.54
පාරිතෝෂික ගෙවීම්	1,334,945.00	696,980.00
නිවාස ව්‍යාපෘති ආදායම්-නැවත ගෙවීම්	16,780,000.00	-
සහස්පුර ඔප්පු ගාස්තු	391,600.00	121,120.00
	210,444,712.57	167,517,487.81
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**244,362,534.35**	**781,878,747.00**

ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
<u>ලැබීම්</u>		
භාණ්ඩාගාර ප්‍රදාන (මානව සංවර්ධන හා ප්‍රාග්ධන වැඩසටහන්)	4,500,000.00	154,996,000.00
ණය වාරික	115,673,249.74	10,880,239.25
වාහන විකුණුම්	-	15,919,907.00
ස්ථාවර තැන්පතු පොළී ආදායම්	106,655,818.69	8,722,329.47
ආපදා ණය	2,237,130.18	6,356,685.06
නා.ජ.ස.අ සේවක නිවාස ණය අයකිරීම්	258,961.77	3,926,460.72
	229,325,160.38	**200,801,621.50**
<u>වියදම්</u>		
නිවාස ව්‍යාපෘති වියදම්	30,354,142.02	69,955,186.90
ව්‍යාපෘති නඩත්තු වියදම්	2,125,437.74	688,995.00
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	61,592,264.98	7,354,375.91
ආපදා ණය ගෙවීම්	11,775,866.97	2,250,000.00
අධ්‍යාපන ණය ගෙවීම්	60,000.00	236,250.00
විසිරි නිවාස ණය (අඟුලාන)	500,000.00	-
ගෙවූ පොළී මුදල්-කළමණාකරන සංස්ථා අරමුදල	4,744,754.13	-
ආයෝජන -ස්ථාවර තැන්පතු	380,251,854.45	524,500,000.00
	491,404,320.29	604,984,807.81
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(262,079,159.91)**	**(404,183,186.31)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය		
<u>ලැබීම්</u>		
කළමණාකරන සංස්ථා අරමුදල	13,417,500.00	22,252,000.00
	13,417,500.00	**22,252,000.00**
<u>වියදම්</u>		
නැවත ගෙවීම්-භාණ්ඩාගාර ණය	125,016,000.00	-
ලුනාව කළමණාකරන සංස්ථා අරමුදල	500,000.00	-
අඟුලාන කළමණාකරන සංස්ථා අරමුදල	202,000.00	412,000.00
	125,718,000.00	**412,000.00**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(112,300,500.00)**	**21,840,000.00**

මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/(අඩු වීම)	(130,017,125.56)	399,535,560.69
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	448,179,922.48	48,644,361.79
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	318,162,796.92	448,179,922.48

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය								
2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා								
ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය								
විස්තරය	ආරම්භක ශේෂය		ප්‍රවර්ථන වර්ෂය තුල සිදු වූ වෙනස්කම්				අවසන් ශේෂය	
	2021	**2022**	**2021**		**2022**		**2021**	**2022**
			එකතු කිරීම්	අඩු කිරීම්	එකතු කිරීම්	අඩු කිරීම්		
මූලික ප්‍රාග්ධන ගිණුම	-	-	-	-	-	-	-	-
ඒකාබද්ධ අරමුදල් ගිණුම	6,641,977.00	6,641,977.00	-	-	-	6,641,977.00	6,641,977.00	-
භාණ්ඩාගාර ප්‍රදාන ගිණුම	1,993,016,243.85	716,109,824.18	125,016,000.00	1,401,922,419.67	1,415,009,238.89	143,962,476.64	716,109,824.18	1,987,156,586.43
රාජ්‍ය ප්‍රදාන ගිණුම	68,332,962.51	108,034,839.91	46,380,830.70	6,678,953.30	367,052,974.00	4,189,777.14	108,034,839.91	470,898,036.77
ස්ථාවර වත්කම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	5,300,102.84	5,745,875.31	3,000,000.00	2,554,227.53	4,500,000.00	1,641,645.49	5,745,875.31	8,604,229.82
මානව සංවර්ධන වැඩසටහන	6,285,000.00	6,285,000.00	-	-	-	2,612,294.14	6,285,000.00	3,672,705.86
ආදායම් සංචිත ගිණුම	36,625,000.00	36,625,000.00	-	-	-	-	36,625,000.00	36,625,000.00
ප්‍රත්‍යාගණන සංචිත ගිණුම	39,318,995.55	39,259,145.55	-	59,850.00	-	743,795.48	39,259,145.55	38,515,350.07
සමුච්චිත අරමුදල් ගිණුම	97,666,409.77	882,285,780.89	784,619,371.09	-	1,053,658,538.66	1,200,706,391.42	882,285,780.86	735,237,928.13
එකතුව	**2,253,186,691.52**	**1,800,987,442.84**	**959,016,201.79**	**1,411,215,450.50**	**2,840,220,751.55**	**1,360,498,357.31**	**1,800,987,442.81**	**3,280,709,837.08**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HUD/C/USDA/FA/22/01 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 ජූනි 30 දින

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 45 හා 46 ඡේද ප්‍රකාරව ප්‍රමාණාත්මක හා සමාන අයිතම පන්තීන් වෙන වෙනම ඉදිරිපත් කල යුතු අතර සමාහරණය හා වර්ගීකරණය කරන ලද සංක්ෂිප්ත දත්තයන් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කල යුතු වේ. එසේ වුවද අධිකාරිය විසින් ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී සමාන අයිතම සාරාංශ කර දැක්වීම වෙනුවට විස්තරාත්මක ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 9 වන ඡේදය ප්‍රකාරව මුදල් සහ මුදල් හා සමාන දෑ යන්නට අත්පත් කරගත් දිනයේ සිට මාස 03 ක් හෝ ඊට අඩු කෙටි කාලීන ආයෝජන ඇතුලත් වේ. එහෙත් අධිකාරිය විසින් රු.මිලියන 258 ක් වටිනා මාස 03 ක කල්පිරීමේ කාලයක් සහිත ස්ථාවර තැන්පතුවල වටිනාකම මුදල් සහ මුදල් හා සමාන දෑ ලෙස ඇතුළත් කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වෙන මුදල් සහ මුදල් හා සමාන දෑ එම අගයෙන්ම ඌන ගණනය වී තිබුණු අතර ආයෝජන අගය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 වන ඡේදය අනුව අස්ථිත්වයක් විසින් පූර්ව කාල පරිච්ඡේද වැරදි සොයා ගැනීමෙන් පසුව, නිකුත් කිරීම සඳහා අනුමත කරන ලද පළමු මූල්‍ය ප්‍රකාශ කට්ටලයෙහි වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කළ යුතු වේ. එහෙත් අධිකාරිය විසින් 2015 ඔක්තෝබර් 02 වන දිනැති අංක 05/2015/04 වන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව නවතා දැමීමට තීරණය කර තිබූ සීතාවක නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා රජයෙන් ලද රු. මිලියන 2.41 ක ප්‍රදානයන්වලට අදාළ ගැළපුම් එම වර්ෂයට අදාලව සිදු නොකර සමාලෝචිත වර්ෂය තුළදි සිදු කිරීම නිසා අධිකාරියෙහි සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම අගයෙන්ම අධිගණනය වී තිබුණි. තවද, ඉකුත් වර්ෂයට අදාළව අධිකාරිය විසින් ගෙවන ලද රු. මිලියන 1.59 ක් වූ දිරිදීමනා සමාලෝචිත වර්ෂයට අදාළව ගැලපීම් කර නිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් ඌන ගණනය වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතියේ 55 ඡේදය ප්‍රකාරව, දේපළ පිරියත හා උපකරණ ඉවත් කළ විට ශුද්ධ වත්කම් / ස්කන්ධය තුළ ඇතුළත්ව ඇති එම වත්කම්වල ප්‍රත්‍යාගණන අතිරික්තය සෘජුවම සමුච්චිත අතිරික්තයට හෝ ඌනතාවයට මාරු කළ යුතු වේ. එසේ වුවද අධිකාරිය විසින් වර්ෂය තුලදී ඉවත් කරන ලද වත්කම් 55

කට අදාලව ඉකුත් වර්ෂයන්හිදි හඳුනාගෙන ගිණුම්ගත කර තිබූ රු.මිලියන 0.74 ක ප්‍රත්‍යාගණන අතිරික්ත ප්‍රත්‍යාගණන සංචිත ගිණුමින් ඉවත් කර සමුච්චිත අතිරික්ත ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගැලපීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

(ii) රජයේ ප්‍රදානයක් ලෙස 2019 අප්‍රේල් 24 වන දින දීමනා පත්‍ර අංක 4/7/7422 යටතේ අධිකාරිය වෙත පැවරී ඇති අනුරාධපුර තුරු ඉතුරුගම ඉඩම් කොටස් 108 න් ඉඩම් කොටස් 6 ක, සුධාරක තාක්ෂණය යටතේ ඉදිකරනු ලැබූ නිවාස 06 හි වටිනාකම රු.මිලියන 5.92 ක් ලෙස 2016 වර්ෂයේදී තක්සේරුකර තිබුණි. එසේ වුවද 2022 ඔක්තෝබර් 10 දින ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන ආයතනය විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ලබා දෙන වාර්තාව අනුව දුර්වල ඉදිකිරීම් ක්‍රම භාවිතා කරමින් මෙම නිවාස සකස් කර ඇති බවත් මැටි සහ සිමෙන්ති යොදා සකස් කරන ලද බිත්තිවලට වහලය දරා සිටිය නොහැකි බවත් මේ නිසා මෙම නිවාස මිනිස් වාසයට නුසුදුසු බවත් දක්වා තිබුණි. ඒ අනුව මෙම නිවාසවල වටිනාකම අඩුවීම හානිකරණ (impairment) ලෙස හඳුනාගත යුතු වුවත් එසේ හඳුනාගෙන නොතිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

කෙසේ වුවද රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 මැයි 18 දින ඉදිරිපත් කර තිබූ තක්සේරු වාර්තාව අනුව එම නිවාස 06 හි වටිනාකම රු. මිලියන 7.55 ක් ලෙස 2016 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාවට වඩා රු.මිලියන 1.62 කින් අගය වැඩිකර ලබා දී තිබුණි. එම තක්සේරුව ලබා දීමේදී සිමෙන්තියෙන් සකස් කරන ලද අනෙක් නිවාස 102 හා සමානව මෙම නිවාස 6 සලකා තිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව මේ තක්සේරුව මතභේදයට තුඩුදෙන බව නිරීක්ෂණය විය.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11

(i) ප්‍රමිතියේ 10 ඡේදය සහ IG 30 සහ 31 ඡේද ප්‍රකාරව අස්තිත්වයක් වෙත ලැබුණ සම්පත් වලට ප්‍රතිචාරයක් ලෙස අස්තිත්වය සෘජුව යම් ප්‍රතිශ්‍යාවක් ලබාදෙනු ලැබිය හැකි නමුත් එය ලැබූ සම්පත්වල සාධාරණ අගයට සමාන නොවන අවස්ථාවලදි හුවමාරු වන සහ හුවමාරු නොවන ගණුදෙනුවල සංයෝජනයක් තිබෙදැයි එම අස්තිත්වය තීරණය කරනු ලැබිය යුතු අතර එම සෑම සංරචකයක්ම වෙන වෙනම හඳුනා ගත යුතු වේ. එහෙත් ඊට පටහැනිව සාධාරණ අගය රු.මිලියන 120 ක් ලෙස තක්සේරු කර තිබූ අක්කර 9 රූඩ් 3 පර්චස් 21.10 ක වපසරියකින් යුත් නිට්ටඹුව ඔර්වඩ් වත්ත ඉඩමින් අක්කර 9

පර්වස් 20.2 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අධිකාරියට ලබා දී ඒ වෙනුවෙන් අධිකාරියෙන් රු. මිලියන 60 ක් පමණක් අයකර තිබූ අතර ගෙවීමට සිදු වූ මුදල පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. අධිකාරිය විසින් පවරා දෙන ලද කොටසෙහි වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කිරීමට හෝ අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ii) ප්‍රඥප්තියේ 17 ඡේදයේ විධිවිධානවලට අනුව අදාළ ප්‍රවර්ථන බැඳීම් ප්‍රඥප්තිය අනුව ගිණුම්ගත කල යුතු වුවද ලුනාව නිවාස ව්‍යාපෘතිය සඳහා රජයෙන් ලබා දී තිබූ රු.මිලියන 1,267.32 ක මුදල් 2020 දෙසැම්බර් 02 දිනැති අංක අමප/20/1844/306/055 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ආපසු රජයට ගෙවිය යුතු වුවද ප්‍රවර්ථන බැඳීම් ගිණුම්ගත කර නොතිබුණි. එම රාජ්‍ය ප්‍රදාන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් හා සංචිත යටතේ දක්වා තිබීම හේතුවෙන් හිමිකම් හා සංචිත එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

(iii) ප්‍රඥප්තියේ 14, 15, 16 , 76 ඡේද සහ IG 18,19,20 සහ 21 ඡේද වල දක්වා ඇති විධිවිධාන වලට අනුව හුවමාරු නොවන ගණුදෙනු වලින් වන අයහාර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට හඳුනා ගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අධිකාරිය වෙත ලැබී තිබූ භාණ්ඩාගාර ප්‍රදානවලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන සමුච්චිත ශේෂය රු.මිලියන 2,458.05 ක් ප්‍රඥප්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර නොතිබුණි.

තවද ප්‍රඥප්තියේ 42 ඡේදය ප්‍රකාරව, හුවමාරු නොවන ගණුදෙනුවක් මගින් අත්පත්කර ගත් වත්කමක් මුල්වරට මැනිය යුත්තේ අත්පත් කර ගත් දින සාධාරණ වටිනාකමට වුවද, නිදහස් දීමනාවක් ලෙස සංස්ථාව වෙත ලැබුණු මොරටුව ලුනාව රජය සතු ඉඩම 2022 වර්ෂයේදී අධිකාරිය වෙත පැවරී තිබුණු අතර 2022 වර්ෂය තුල අදාල නිවාස ව්‍යාපෘතිය සම්පූර්ණ කර තිබුණි. එසේ ඉදිකරන ලද නිවාස 356 විකුණුම් පදනම මත බැහැර කර තිබුණද එම බැහැර කිරීමේ පිරිවැය ගණනයේදී මෙම ඉඩමේ පිරිවැය සැලකිල්ලට ගෙන නොතිබුණි. මේ නිසා නිවාස පිරිවැය ගණනයේ නිවැරදිභාවය ගැටලු සහගත වේ. මෙම ඉඩමෙහි සාධාරණ වටිනාකම ගණනය කර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූල්‍ය ප්‍රකාශනවල ගැළපුම් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(iv) ප්‍රඥප්තියේ 94 සහ 96 ඡේදවල සඳහන් ප්‍රතිපාදනවලට පටහැනිව අධිකාරියට සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.මිලියන 8.6 ක ප්‍රාග්ධන ප්‍රදාන, හිමිකම් හා සංචිත යටතේ දක්වා තිබූ අතර රු. මිලියන 14 ක විලම්භීත ආදායම්ද හඳුනාගෙන තිබුණි.

(v) ප්‍රමිතියේ 106 සහ 107 ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළදි හුවමාරු නොවන ගණුදෙනු වලින් ලත් අයභාරයේ වටිනාකම ප්‍රධාන පන්ති මගින් වෙන් වෙන්ව පෙන්වමින් මූල්‍ය ප්‍රකාශන වල මුහුණත හෝ සටහන්වල හෙළිදරවු කළ යුතු අතර එසේ හුවමාරු නොවන ගණුදෙනු වලින් ලත් අයභාරය හඳුනාගැනීම සඳහා අධිකාරිය මගින් යොදා ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිද හෙලිදරව් කළ යුතු වුවද එම හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12

(i) ප්‍රමිතියේ 14 (අ) ඡේදයට අනුව කල්බදු ගිවිසුම අවසානයේ වත්කම්වල අයිතිය කල්බදු ගැනුම්කරුවන් වෙත පැවරෙන්නේ නම් එය මූල්‍ය කල්බදු ලෙස හඳුනාගත යුතු වේ. ඒ අනුව අධිකාරිය විසින් වාණිජ පදනම මත දිගු කාලීන කල්බදු ගිවිසුම් අනුව ආයතනයේ සේවකයන්ට බැහැර කරන ලද ලුනාව නිවාස ව්‍යාපෘතියේ නිවාස 22 ක් මූල්‍ය කල්බදු ලෙස හඳුනාගත යුතු වුවත්, මෙම ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය කල්බදු ලෙස හඳුනාගෙන නොතිබුණි. සියයට 25 ක මූලික ගෙවීම පමණක් සම්පූර්ණ කර තිබූ නිසා මෙම නිවාස පැවරීම් විකුණුම් ලෙසද වර්ෂය තුලදී හඳුනාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් සුදුසු ගිණුම් ප්‍රතිපත්තියක්ද හඳුනාගෙන නොතිබුණි.

(ii) අධිකාරිය විසින් මෙම ප්‍රමිතියට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදි විකුණන ලද නිවාස ව්‍යාපෘති 04 කට අදාළව රු. මිලියන 20.61 ක් ආදායම් ලෙස හඳුනාගෙන තිබූ අතර මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින්ම අධි ගණනය වී තිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 13 හි 7 වන ඡේදය ප්‍රකාරව, අයෝජන දේපළ යනු බදුකුලී ඉපයීම හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම සඳහා හෝ ඒ අරමුණු දෙකම සඳහා තබාගෙන ඇති ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලකින් කොටසක් හෝ දෙකම වේ. කෙසේ වුවද අධිකාරිය බදු කුලී පදනම මත ලබාදී තිබූ නිවාස ව්‍යාපෘති 3 කට අදාල රු. මිලියන 146.76 ක් වටිනා නිවාස හා වාණිජ ඒකක ආයෝජිත දේපළ ලෙස හඳුනා නොගෙන ස්ථාවර වත්කම් යටතේ ඇතුලත් කර තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 96 වන ඡේදය අනුව නියත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක ක්ෂය ලියා හැරිය යුතු ප්‍රමාණයන් කිසියම් විධිමත් පදනමක් මත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට බෙදා හැරිය යුතු වුවත් අධිකාරිය සතු රු.500,000 ක් වටිනා ගිණුම්කරණ මෘදුකාංගය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදි කිසිදු ක්‍රම ක්ෂය වියදමක් හඳුනාගෙන

නොතිබුණි. තවද ප්‍රමිතියෙහි 117 වන ඡේදය ප්‍රකාරව, අස්පෘශ්‍ය වත්කම්වලට අදාළව සිදුකළ යුතු හෙළිදරව් කිරීම්ද මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(එ) 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය රු. මිලියන 51.48 ක් වුවද රඳවා ගැනීමේ බදු රු. මිලියන 2.71 සමඟ ලැබිය යුතු පොලිය රු. මිලියන 54.19 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.මිලියන 2.71 කින් අධි ගණනය වී තිබුණි.

(ඒ) අධිකාරියෙහි අරමුදලින් මුදල් ප්‍රතිපාදන වෙන් කර ගෙන සේවකයන්ට ආපදා ණය ලබාදීම සඳහා පවත්වාගෙන යනු ලබන ආපදා ණය ප්‍රතිපාදන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 15 ක් හිමිකම් හා සංචිත යටතේ දක්වා නොතිබූ අතර ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් එම අගයෙන් ජංගම නොවන වගකීම් අධි ගණනය වී හිමිකම් හා සංචිත ඌණ ගණනය වී තිබුණි.

(ඔ) අධිකාරියේ අලෙවි අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට ලුනාව නිවාස ව්‍යාපෘතිය තුළින් වාණිජ පදනම මත බැහැර කරන ලද නිවාස ඒකක 178 කින් රු. මිලියන 448.1 ක් ලැබිය යුතු ලෙස දක්වා තිබුනද මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම වටිනාකම රු. මිලියන 435.5 ක් වීම හේතුවෙන් ඒ අතර රු. මිලියන 12.56 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) 2022 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට නිවාස ව්‍යාපෘතියට අදාළව 2016 වර්ෂයේ සිට අයකර ගත යුතු මුළු හිඟ ණය වාරික වටිනාකම වන රු.මිලියන 3.4 ක් ලැබිය යුතු ගිණුම් ලෙස ජංගම වත්කම් යටතේ පෙන්නුම් කළ යුතු වුවත් එය ජංගම නොවන වත්කම් යටතේ දැක්වීම නිසා අධිකාරියෙහි ජංගම වත්කම් එම වටිනාකමින්ම ඌන ගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. පහත විස්තර කර ඇති පරිදි, අනෙකුත් තොරතුරු වල එවැනි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් පවතින බව මම නිගමනය කරමි.

(අ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලුනාව නිවාස ව්‍යාපෘතිය මඟින් නිවාස ඒකක 341 ක් විකුණා තිබූ අතර ඉන් නිවාස ලාභීන් 128 දෙනෙකු විසින් සම්පූර්ණ මුදල රු. මිලියන 646.08 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, අධිකාරියේ සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික වාර්තාවට අනුව නිවාස ලාභීන් 140 දෙනෙකු විසින් රු. මිලියන 664.08 ගෙවා ඇති ලෙස දක්වා තිබුණි.

(ආ) එසේම නිවසක වටිනාකමින් සියයට 50 ක් පමණක් ගෙවා තිබෙන නිවාස ඒකක වලට අදාළ නිවාස විකුණුම් වටිනාකම රු. මිලියන 912.38 ක් ද එම නිවාස ඒකක වලට අදාළ මුදල් ලැබීම් වටිනාකම රු. මිලියන 464.28 ක් වුවද කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව එම අගයන් පිළිවෙලින් රු. මිලියන 912.91 ක් සහ රු. මිලියන 460.38 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) නිවසක වටිනාකමින් සියයට 25 ක් පමණක් ගෙවා තිබෙන නිවාස ඒකක ගණන 12 ක් සහ එම නිවාස විකුණුම් වටිනාකම රු. මිලියන 61.62 ක් වුවත් කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ එම අගය පිළිවෙලින් නිවාස ඒකක 13 ක් සහ රු. මිලියන 66.36 ක් ලෙස දක්වා තිබුණි.

අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12

(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධානයන්ට යොමුව	නිරීක්ෂණ
(අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත	
(i) පනතේ හැදින්වීම	නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 14 ක් ගතවුවද ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. කෙසේ වුවද රේඛීය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක

කරන ලද කොළඹ පුනර්ජීවනය සඳහා සහය දීම සඳහා වූ ව්‍යාපෘතියේ (SURP) එක් සංරචකයක් ලෙස නාගරික පුනර්ජීවන ප්‍රතිපත්තියක් සකස් කිරීම ඇතුලත් කර තිබූ අතර එහි කෙටුම්පතක්ද සකස් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) 10 වන වගන්තිය

අධිකාරිය විසින් සභාපතිවරයකුද ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් වන විට පත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණුවලට අදාල කාර්යයන් හඳුනාගෙන නොතිබුණි.

(iii) 16 (1) (ඉ) උප වගන්තිය

මෙම වගන්තියේ ප්‍රතිපාදන අනුව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුව තිබුණි. එසේ වුවත් 2010 දෙසැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 10/2951/504/012 අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට එම ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. සේවා ගාස්තු අයකිරීම නවතන අවස්ථාව වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අය කර ගෙන තිබූ රු. මිලියන 207.33 ක සේවා ගාස්තු මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(iv) 16 (3) උප වගන්තිය

අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 14 ක් ගතවී තිබුනද අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් ලබාදී නොතිබුණි.

(ආ)	1971 අංක 38 දරන මුදල් පනත 11 (ආ) වගන්තිය	මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධිකාරිය විසින් පසුගිය වර්ෂයේ රු. මිලියන 1,195 ක් හා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 958 ක් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021	චක්‍රලේඛයට අනුව සංයුක්ත සැලැස්මක් වසර 5 ක් සඳහා පිළියෙල කර ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ ඊළඟ වර්ෂය ආරම්භ වීමට දින 15 කට ප්‍රථම අදාළ පාර්ශවයන් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර රජය සතු ව්‍යාපාර සඳහා වූ යහපාලන මාර්ගෝපදේශ සංග්‍රහයේ B කොටසේ ඇති ආදර්ශය අනුව අධිකාරිය විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. තවද වර්ෂයේ ප්‍රධාන අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම් ඇතුළත් විය යුතු වුවද අධිකාරිය විසින් 2022 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ වාර්ෂික අයවැය ලේඛණයෙහි එම කරුණු ඇතුළත් වී නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

බලතල, කර්තවය, කාර්යයන්	නිරීක්ෂණ
2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 15 ඡේදය	නාගරික ජනාවාස ප්‍රදේශයක ප්‍රජාවගේ සාමාන්‍ය සුභසිද්ධිය සහ සමාජ සහ සංස්කෘතික දියුණුව වැඩි දියුණු කිරීම හා එම ප්‍රදේශයේ කටයුතු පරිපාලනය කිරීම සිදු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී තාවකාලික අත්හිටුවන ලැබූ තුඩුවේගොඩ හා නාවලපිටිය නාගරික අඩු අදායම් නිවාස ව්‍යාපෘති 02 හැරුණු කොට කිසිදු භෞතික සංවර්ධන කටයුත්තක්

සිදුකර නොතිබුණු අතර මානව සංවර්ධන වැඩසටහන් 05 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) අධිකාරිය විසින් නිවාස ඒකක 512 ක් සහිත ඉදිකිරීම් නිම කළ නිවාස යෝජනා ක්‍රම 03 ක් හා ඉදිකරමින් පවතින නිවාස යෝජනා ක්‍රමයක් පිහිටි හෙක්ටයාර 2.32 ක ඉඩම් අදාල ආයතනවලින් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත්ව තිබුණි. එම හේතුවෙන් ඉදිකර අයිතිය හාර දී ඇති නිවාසලාභීන්ට ඉඩම් ඔප්පු ලබාදීමේ ප්‍රමාදයන් මත නිවාස ක්‍රමවල කළමණාකරන සංස්ථා පිහිටුවා නිවාස වල භාරකාරත්වය පැවරීමට නොහැකි වී තිබුණි.

(ආ) අධිකාරිය විසින් ලුනාව නිවාස ඒකක 356 ම විකුණුම් පදනම මත ඉකුත් වර්ෂයේදි බැහැර කර තිබුණද නිවාස ලාභීන් වෙත ඔප්පු ලබාදීම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකර නොතිබුණි. මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, සභාධිපත්‍ය කළමණාකරන අධිකාරිය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, සහ මොරටුව මහ නගර සභාව මගින් ලබාගත යුතු අනුමැතීන් ලබා නොගැනීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඇ) අමාත්‍ය මණ්ඩල තීරණ අංක MUDRH/2020/CP/45 ට පටහැනිව අධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 01/2021/15 මගින් ලබාගෙන ඇති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව අධිකාරියේ නිලධාරීන්ට නිවාස ලබාදීමෙදි නිවාස විකුණුම් මිල තීරණය කිරීමෙදි අධිකාරිය වෙත අයකරනු ලබන සියයට 20 ක සේවා ගාස්තුව අධිකාරියේ නිලධාරීන්ගේ අය නොකිරීමටත් නිවසක විකුණුම් මිල ලෙස රජයේ තක්සේරුව පමණක් අයකර එම පිරිවැය අවුරුදු 25 ක කාලයක් තුළ සියයට 2 ක සහනදායී වාර්ෂික පොළී අනුපාතිකයක් යටතේ ගෙවීම් සිදුකිරීම සඳහා පහසු ගෙවීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් තීරණය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරියේ නිලධාරීන්ට නිවාස ඒකක 22 ක් ලබාදී තිබුණු අතර අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව කටයුතු කිරීම මත රජයට අහිමි වූ වටිනාකම රු. මිලියන 18.96 ක් වී තිබුණි.

(ඈ) 2022 ජුනි මස 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 05/2022/06 යටතේ රු. මිලියන 44.78 ක් වටිනා බදු දීමෙන් අධිකාරිය වෙත බදු ආදායම් උපයාගත හැකිව තිබූ සහස්පුර වාණිජ ඒකක 67 ක් හා වටිනාකම හඳුනාගෙන නොතිබූ සේවා ඒකක

57 ක් නිදහස් දීමනාවක් මත කළමණාකරන සංස්ථාවට බැහැර කිරීමට තීරණය කර තිබුණි.

(ඉ) 2020 දෙසැම්බර් 22 දිනැති අංක /20/1844/306/055 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විකුණුම් මිලෙන් සියයට 50 ක අයකර ගැනීමකින් තොරව රු. මිලියන 4.74 ක වටිනා ලුනාව නිවාස ක්‍රමයේ නිවාස අංක 1/3/3 දරණ නිවාස ඒකකයේ විකුණුම් වටිනාකමින් සියයට 25 ක් එනම් රු. මිලියන 1.185 ක් පමණක් අයකර ගෙන නිවසේ භුක්තිය බාරදී තිබුණි.

(ඊ) අධිකාරිය විසින් ධීවර ජනතාව වෙනුවෙන් ඉදිකළ අහුලාන මහල් නිවාස ක්‍රමයෙහි පැවති නිවාස 288 කින් රු.මිලියන 62.87 ක් වටිනා නිවාස ඒකක 53 ක් මුදල් අයකිරීමෙන් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් 2016 සැප්තැම්බර් 26 වන දින සිට 2019 පෙබරවාරි මස 12 අතර කාලය තුළ සිනමා ශිල්පීන්ට හා ක්‍රීඩකයන්ට භුක්තිය ලබාදී තිබුණි. පසුව එනම් 2019 සැප්තැම්බර් මස 18 දිනැති හා අංක අමප/අංක/19/2761/122/085 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම නිවාස සඳහා සාධාරණ මුදලක් ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට දන්වා තිබුණු නමුත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. එමෙන්ම නීතිපතිතගේ 2022 දෙසැම්බර් 04 දිනැති ලිපියෙහි උපදෙස් පරිදි නිවාස 32 ක නිදහස් දීමනා අවලංගු කිරීමටද කටයුතු කර නොතිබුණි.

(උ) සීමාසහිත රියල් එස්ටේට් එක්ස්වේන්ජ් (පුද්ගලික) සමාගම අධිකාරියට පවරා ගැනීමෙදි සිදුව තිබූ රු. මිලියන 47.75 ක මූල්‍ය වංචාවට අදාළව නීතිපති විසින් 2021 ඔක්තෝබර් 28 දින ලබා දෙන ලද නීති උපදෙස් අනුව අලාභය අයකර ගැනීම සඳහා අදාළ පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරිය හැකිද යන්න සලකා බැලීම සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 103 (පරිච්ඡේද II) පරිදි කටයුතු කර වගකිව යුතු පුද්ගලයින් හා රජයට සිදුවී ඇති අලාභය නිවැරදිව ගණනය කළ යුතු බව දන්වා තිබුණද රේඛීය අමාත්‍යාංශය විසින් 2023 ජුනි වන විටත් ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි.

(ඌ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක DMS/1523(Vol – 1) සහ 2019 මැයි 22 දිනැති ලිපිය මගින් අධිකාරියේ අනුමත තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය පැරණි ආකෘතියට අනුව සකස් කරන ලද්දක් බැවින් එය නව ආකෘතිය අනුව යාවත්කාලීන කර ඇනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත්, 2023 අප්‍රේල් වන විටත් එලෙස කටයුතු කර නොතිබුණි.

(එ) 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 153 ක් හා අනුමත කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය 13 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්යමණ්ඩලය පිළිවෙලින් 126 හා 03 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 37 ක් වූ අතර

මෙලෙස පුරප්පාඩු පැවතීම ආයතනයේ පහළ කාර්ය සාධනයට සෘජුව බලපා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතට අනුව ඉටු කළ යුතු නාගරික පදිංචිකරුවන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය හඳුනාගැනීමට අදාල වන සමීක්ෂණ හා අධ්‍යනය කටයුතු පැවැත්වීම සහ ජාතික වශයෙන් අදාලවන නාගරික නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර හෝ ඉටු කර නොතිබුණි.

(ආ) අධිකාරියෙහි 2022 වර්ෂයේ පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති 06 ක් නිම කිරීමට සැලසුම් කර තිබූ අතර ව්‍යාපෘති 02 ක කිසිදු භෞතික ප්‍රගතියක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අත්කර ගෙන නොතිබුණි. එමෙන්ම ව්‍යාපෘති 04 කට අදාළ කටයුතු වලින් සියයට 5 සිට සියයට 16 දක්වා භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබූ අතර මුල්‍ය ප්‍රගතිය සියයට 1 සිට සියයට 69 දක්වා විය. එමෙන්ම 2022 වර්ෂයේ ආරම්භ කර තාවකාලිකව අත්හිටුවන ලද ව්‍යාපෘති 02 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුළ විගණන අංශය වෙනුවෙන් අභ්‍යන්තර විගණක තනතුර පමණක් අනුමත කර තිබුණු අතර විගණන නිලධාරි තනතුරු ඇතුලත් කර නොතිබුණි. මේ පිළිබඳව පසුගිය විගණකාධිපති වාර්තාවලින්ද පෙන්වාදී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළ හෝ අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර මධ්‍යම කළමණාකරන මට්ටමේ (MM) තනතුරක් ලෙස තවදුරටත් පවත්වාගෙන ගොස් තිබූ අතර විගණන නිලධාරීන් බඳවාගැනීමකින් තොරව කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ඇතුළත් විගණන වැඩසටහන් 18 කින් වැඩ සටහන් 4 කට අදාළ විගණන වැඩ සටහන් හා අධිකාරියේ කාර්ය සාධන ඇගයීම්ද සිදුකර තිබුණි.

(ඈ) ආයතනය විසින් සළුලදායී පාලන උපක්‍රමයක් ලෙස අයවැය භාවිතා කර නොතිබුණු අතර අයවැය ගත කරන ලද වියදම් සත්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 1 සිට 232 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. තවද අයවයෙන් වෙන් කර නොතිබූ වියදම් වියදම් අයිතම 06 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් රු. 1,974,419 ක් වැය කර තිබුණි.

(ඉ) අධිකාරිය විසින් පුනස්ථාපන පදනම මත නිවාස ලබා දුන් නිවාස ව්‍යාපෘති 06 කට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසානයට අයකර ගත යුතු මුළු ණය වාරික වටිනාකම රු.මිලියන 112 ක් වූ අතර ඉන් වසර 2-5 ත් අතර කාලයක සිට අයකර ගත යුතු ණය ශේෂය රු.මිලියන 47.31 ක් වූ අතර වසර 05 ඉක්මවා අයකර ගත යුතු ණය ශේෂය රු.මිලියන 30.12 ක් වූ අතර එම වටිනාකම මුළු ණය වාරික වටිනාකමින් පිළිවෙලින් සියයට 42 ක් හා සියයට 27 ක් විය.

(ඊ) අධිකාරිය විසින් විකුණුම් පදනම මත ලබාදුන් නිවාස ව්‍යාපෘති 04 කට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසානයට අයකර ගත යුතු මුළු ණය වාරික වටිනාකම රු.මිලියන 42.5 ක් වූ අතර ඉන් වසර 2 -5 අතර කාලයක සිට අයකර ගත යුතු ණය ශේෂය රු. මිලියන 11.3 ක් වූ අතර වසර 5 ඉක්ම වූ අයකර ගත යුතුව පැවති ශේෂය රු. මිලියන 22.8 ක් විය. එම වටිනාකම මුළු ණය වාරික වටිනාකමින් පිළිවෙලින් සියයට 27 හා සියයට 54 ක් විය.

(උ) ලුනාව නිවාස ඒකක බැහැර කිරීමේදි මූලික ගෙවීම ලෙස නිවසක මුළු වටිනාකමින් සියයට 25 ක් අධිකාරියට අයකර ගැනීමටත් ඉතිරි සියයට 75 සඳහා රාජ්‍ය බැංකුවක් සමඟ සම්බන්ධ වී වසර 25 ක් තුළ ගෙවීමේ ණය පහසුකම ප්‍රතිලාභීන් වෙත සලසා දීම හා එම සියයට 75 ක මුදල මාස 3 ක් ඇතුළත අධිකාරියට අයකර ගැනීමටත් 2020 දෙසැම්බර් 22 දිනැති අංක අමප/20/1844/306/055 දරණ අමාත්‍ය මණ්ඩලය තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වුවද 2021 අප්‍රේල් 09 වන දින ජනතා අයිතියට පත්කරන ලද මෙම නිවාස ව්‍යාපෘතියෙන් 2022 දෙසැම්බර් 31 දින වන බැංකු ණය පදනම යටතේ නිවාස ලබා ගන්නා ලද නිවාස ලාභීන් 12 වෙනුවෙන් බැංකු මගින් එම විකුණුම් වටිනාකම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති.